# රාජ්‍ය මූල්‍ය කටයුතු

## සමස්ත උපනතීන්


රාජ්‍ය මූල්‍ය අංශය වඩාත් ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කරගෙන යනු ලැබූ ප්‍රතිපත්තීන්හි නිවැරදි කිරීම් 1994 වර්ෂය තුළ පැවති මැතිවරණ කටයුතු නිසා පසුබෑමකට ලක් වූ අතර එය රටෙහි සාර්ව ආර්ථික ස්ථාවරභාවය කෙරෙහි තදබල ලෙස අහිතකර බලපෑමක් ඇති කරන ලදී. රජයේ අභිමතය පරිදි බදු අයකිරීමේදී සිදු කරන ලද විවිධ වෙනස්කම් සහ රාජ්‍ය වියදම්හි සිදු කරන ලද ලිහිල් කිරීම් හි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව 1993 පැවති සියයට 19.7 සිට 1994 වර්ෂයේදී සියයට 19.0 දක්වා පහළ වැටුණු අතර, දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව රජයේ වර්තන වියදම 1993 පැවති සියයට 20.5 සිට 1994 දී සියයට 22.0 දක්වා වැඩි විය. මෙම තත්ත්වය යටතේ, වර්තන ගිණුමෙහි හිගය දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව 1993 දී පැවති සියයට 0.8 සිට 1994 දී සියයට 2.9 දක්වා වැඩි වූ අතර, එම වැඩිවීම පරිභෝජනය සඳහා රාජ්‍ය මූල්‍ය කටයුතු වල සිදු වූ නැඹුරුව පිළිබිඹු කරයි. එපමණක් නොව රාජ්‍ය ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව 1993 පැවති සියයට 8 සිට 1994 දී සියයට 7 දක්වා පහත වැටී තිබියදීත් රජයේ මුළු වියදම දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව 1993 වසරේදී සියයට 28.1 සිට 1994 දී සියයට 29.0 ක් දක්වා වැඩිවීමට හේතු වූයේ රාජ්‍ය අයවැයෙහි පුනරාවර්තන වියදමෙහි ඉහළ යාමය. 1994 හි සමස්ත ආදායම් සහ වියදම් ප්‍රවාහයන්හි ප්‍රතිඵලයක් ලෙස අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 10.0 වූ අතර, එය 1993 දී සියයට 8.4 ක් විය. 1994 වසරේ සමස්ත අයවැය හිඟය, 1989-1993 කාලපරිච්ඡේදයේද පැවති සාමාන්‍ය අයවැය හිගය වූ සියයට 9.7 මට්ටමට වඩා මදක් වැඩි වී ඇත. විශේෂයෙන්ම පුද්ගලික අංශයෙහි ණය ඉල්ලුම නොකඩවා ඉහළ මට්ටමක පැවතීමේ සහ නිදහස් ආර්ථික පරිසරයක් තුළ විශාල ලෙස මෙරටට ප්‍රාග්ධනය ගලා ඒමේ තත්ත්වයක් යටතේ ඉහළ අයවැය හිඟයක් දිගටම පැවතීම, මෑත වර්ෂවල සාර්ව ආර්ථික කළමණාකරණයේදී අවධානයට ලක් වූ ප්‍රධාන කරුණකි.

## අයවැය තත්ත්වය

1994 වර්ෂයේ රජයේ ආදායම පෙර වර්ෂයට වඩා සියයට 12 ක වැඩිවීමක් සටහන් කරමින් රුපියල් දශලක්ෂ 110,038 වූ අතර, 1993 වර්ෂයේදී එම වැඩිවීම සියයට 15 ක් විය. රජයේ ආදායමෙහි වැඩිවීම දළ දේශීය නිෂ්පාදිතයෙහි නාමික වැඩිවීමට වඩා ඉතා අඩු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව ආදායම, 1993 දී පැවති සියයට 19.7 සිට 1994 දී සියයට 19.0 දක්වා අඩු වූ අතර, එය 1989-1993 කාලච්ඡේදයේදී පැවති එම අනුපාතයේ සාමාන්‍ය අගය වූ සියයට 20.6 ට වඩා බෙහෙවින් පහළ අගයක පැවතිණි. මෑත වර්ෂ වලදී දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව රජයේ ආදායම ක්‍රමයෙන් අඩු වූ අතර, එලෙස රජයේ ආදායම් රැස් කිරීමේ උත්සාහය දුර්වලවීම රාජ්‍ය ආදායම් ව්‍යුහයෙහි පැවති අනම්‍ය ස්වභාවය පමණක් නොව රජයේ බදු පදනම නොකඩවා ඛාදනයවීම බලපෑ අතර, ඒ සඳහා වර්ෂය තුළදී වරින් වර හා විශේෂයෙන්ම මැතිවරණ කාලය තුළදී සිදු කරන ලද විවිධ බදු නිදහස් කිරීම් සහ රජයේ අභිමතයන් පරිදි සිදුකරණ ලද වෙනස්කම් හේතු විය. එමනිසා, ආරක්ෂක බද්ද හා වර්ෂය මුලදී හඳුන්වාදෙනු ලැබූ තෝරාගත් භාණ්ඩ මත පනවනු ලැබූ නිෂ්පාදන බදු මගින් අමතර ආදායම් උපයා ගැනීමට උත්සාහ කොට තිබියදීත් 1994 වර්ෂයේදී සමස්ත ආදායම් රැස් කිරීම ක්‍රමයෙන් පිරිහීමකට පත් විය. විශේෂයෙන්ම වර්තන වියදම් කෙරෙහි ඉහළ ඉල්ලුමක් පවත්නා තත්ත්වයක් යටතේ මෙය රාජ්‍ය මූල්‍ය කටයුතු වල ඇති වූ පීඩාකාරී වර්ධනයක් විය.

මේ අතර, දේශීය ණය සඳහා වූ අධික වියදම, රජයේ සේවකයින්ගේ වැටුප් සහ විශ්‍රාම වැටුප් වියදම ඉහළ යාම සහ විවිධ සුභසාධක වැඩසටහන් යටතේ කුටුම්භ වලට සිදු කරන ලද සංක්‍රාම ගෙවීම් වැඩිවීම නිසා 1994 වර්ෂයේදී වර්තන වියදම සියයට 17 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 127,084 වූ අතර, 1993 දී එය රුපියල් දශලක්ෂ 102,288 ක් විය. ඒ අනුව වර්තන වියදම දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව 1993 වසරේදී පැවති සියයට 20.5 සිට 1994 වසරේදී සියයට 22.0 දක්වා ඉහළ ගිය අතර, එය 1989-1993 කාල පරිච්ඡේදය තුළ පැවති වාර්ෂික සාමාන්‍ය අගය වූ සියයට 22.8 අගය හා ආසන්නව පවතී.

# රාජ්‍ය මූල්‍ය උපනතීන්




ශ්‍රී ලංකා මහ බැංකුව

## 1.58 සංඛ්‍යා සටහන
# රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 අනුමතකළ ඇස්තමේන්තු | 1994 තාවකාලික | 1995 අනුමතකළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| මුළු ආදායම සහ දීමනා | 74,662 | 84,049 | 94,061 | 106,364 | 123,220 | 118,295 | 146,040 |
| මුළු ආදායම | 67,964 | 76,179 | 85,781 | 98.339 | 115,634 | 110,038 | 137,110 |
| බදු ආදායම | 61,206 | 68,157 | 76,353 | 85,891 | 105,276 | 99,417 | 121,324 |
| බදු නොවන ආදායම | 6,758 | 8,022 | 9,428 | 12,448 | 10,358 | 10,621 | 15,786 |
| දීමනා | 6,697 | 7,870 | 8,280 | 8,025 | 7,586 | 8,257 | 8,930 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම | 99,814 | 119,527 | 116,973 | 140,460 | 154,219 | 167,768 | 186,595 |
| වර්තන | 71,771 | 83,756 | 89,639 | 102,288 | 109,367 | 127,084 | 133,424 |
| ප්‍රාග්ධන | 19,529 | 25,304 | 24,948 | 33,662 | 35,233 | 30,391 | 42,668 |
| ආපසු ගෙවීම් අඩුකල පසු ණයදීම | 8,514 | 10,467 | 2,386 | 4,510 | 9,619 | 10,293 | 10,503 |
| වර්තන ගිණුම් අතිරික්තය/ හිඟය (-) | -3,807 | -7,577 | -3,858 | - 3,949 | 6,267 | -17,046 | 3,680 |
| අයවැය හිඟය (දීමනාවලට පෙර) | -31,850 | -43,348 | -31,192 | -42,121 | -38,585 | -57,730 | -49,485 |
| අයවැය හිඟය (දීමනා වලට පසු) | -25,153 | -35,478 | -22,912 | -34,096 | -30,999 | -49,473 | -40,555 |
| පියවීම | 25,152 | 35,478 | 22,913 | 34,096 | 30,999 | 49,474 | 40,555 |
| විදේශීය ණය ගැනීම් | 11,644 | 19,329 | 7,361 | 9,855 | 18,241 | 11,778 | 18,382 |
| දේශීය ණය ගැනීම් | 13,508 | 16,149 | 15,552 | 24,241 | 12,758 | 37,696 | 22,173 |
| වෙළෙඳ පොළ - නොවන | 305 | 691 | -3,205 | 2,012 | - | -666 | - |
| වෙළෙඳ පොල | 13,203 | 15,458 | 18,757 | 22,229 | 12,758 | 38,362 | 22,173 |
| බැංකු - නොවන | 12,946 | 15,423 | 21,079 | 28,308 | 12,758 | 37,205 | 29,578 |
| බැංකු | 257 | 35 | -2,322 | - 6,079 | - | 1,157 | -7,405 |
| **දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්** | | | | | | | |
| මුළු ආදායම සහ දීමනා | 23.2 | 22.6 | 22.1 | 21.4 | 21.7 | 20.4 | 22.2 |
| මුළු ආදායම | 21.1 | 20.4 | 20.2 | 19.7 | 20.3 | 19.0 | 20.8 |
| බදු ආදායම | 19.0 | 18.3 | 17.9 | 17.2 | 18.5 | 17.2 | 18.4 |
| බදු නොවන ආදායම | 2.1 | 2.2 | 2.2 | 2.5 | 1.8 | 1.8 | 2.4 |
| දීමනා | 2.1 | 2.1 | 1.9 | 1.6 | 1.3 | 1.4 | 1.4 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම් | 31.0 | 32.1 | 27.5 | 28.1 | 27.1 | 29.0 | 28.3 |
| වර්තන | 22.3 | 22.5 | 21.1 | 20.5 | 19.2 | 22.0 | 20.2 |
| ප්‍රාග්ධන | 6.1 | 6.8 | 5.9 | 6.7 | 6.2 | 5.3 | 6.5 |
| ආපසු ගෙවීම් අඩුකල පසු ණයදීම | 2.6 | 2.8 | 0.6 | 0.9 | 1.7 | 1.8 | 1.6 |
| වර්තන ගිණුම් අතිරික්තය/ හිඟය (-) | -1.2 | -2.0 | -0.9 | -0.8 | 1.1 | -2.9 | 0.6 |
| අයවැය හිඟය (දීමනාවලට පෙර) | -9.9 | -11.6 | -7.3 | -8.4 | -6.8 | -10.0 | -7.5 |
| අයවැය හිඟය (දීමනා වලට පසු) | -7.8 | -9.5 | -5.4 | -6.8 | -5.4 | -8.5 | -6.1 |
| පියවීම | 7.8 | 9.5 | 5.4 | 6.8 | 5.4 | 8.5 | 6.1 |
| විදේශීය ණය ගැනීම් | 3.6 | 5.2 | 1.7 | 2.0 | 3.2 | 2.0 | 2.8 |
| දේශීය ණය ගැනීම් | 4.2 | 4.3 | 3.7 | 4.9 | 2.2 | 6.5 | 3.4 |
| වෙළෙඳ පොළ - නොවන | 0.1 | 0.2 | -0.8 | 0.4 | - | -0.1 | - |
| වෙළෙඳ පොළ | 4.1 | 4.1 | 4.4 | 4.4 | 2.2 | 6.6 | 3.4 |
| බැංකු - නොවන | 4.0 | 4.1 | 5.0 | 5.7 | 2.2 | 6.4 | 4.5 |
| බැංකු | 0.1 | ... | -0.5 | -1.2 | - | 0.2 | -1.1 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

දුර්වල ආදායම් රැස්කිරීම් සහ ඉහළ වර්තන වියදමක් යටතේ රාජ්‍ය අයවැයෙහි වර්තන ගිණුමෙහි රුපියල් දශලක්ෂ 17,046 ක් වැනි පෙර නොවූවිරූ පරිදි ඉහළ හිඟයක් පෙන්නුම් කළ අතර එය මෑත කාලයේ පැවති වර්තන ගිණුමෙහි හිඟය අඩු වීමේ උපනතියෙහි ආපසුහැරීමක් ලෙස දැකිය හැක. මේ අනුව දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව වර්තන ගිණුමෙහි හිඟය 1992 පැවති සියයට 0.9 සිට 1993 දී සියයට 0.8 දක්වා අඩු වී නැවත 1994 දී සියයට 2.9 දක්වා වැඩි වූ අතර එමගින් රටෙහි දේශීය ඉතුරු කිරීම් ප්‍රයත්නය පසුබෑමකට ලක් කර ඇත. මේ අතර රාජ්‍ය ආයෝජන (ප්‍රාග්ධන වියදම් සහ රාජ්‍ය අයවැය යටතේ වාණිජමය ' ආයතන වලට සිදු කළ ණයදීම්) සුළු වශයෙන් වැඩි වී රුපියල් දශලක්ෂ 40,455 වූ නමුත් එය දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව 1993 වර්ෂයේ පැවති සියයට 8.0 සිට 1994 වර්ෂයේදී සියයට 7.0 දක්වා තියුණු ලෙස පහත වැටීමක් පෙන්නුම් කරන ලදී. රාජ්‍ය ආයෝජන වියදම් ඉතා සුළු වශයෙන් වැඩිවූවද වර්තන වියදමෙහි සිදු වූ තියුණු වැඩිවීම රාජ්‍ය අයවැයෙහි මුළු වියදම 1993 වර්ෂයේ පැවති රුපියල් දශලක්ෂ 140,460 සිට (දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව ලෙස සියයට 28.1) 1994 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 167,768 (දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 29.0) දක්වා වැඩි විය.

රාජ්‍ය ආදායම් හා වියදම් ව්‍යුහයන් විසින් උරුමකොට දෙන ලද පැවති දුර්වල තත්ත්වය මෙන්ම මෙම ආදායම් සහ වියදම් මාර්ග තුළින් සිය අභිමතයන් මත ලබාදෙන ලද තාවකාලික සහනයක් නිසා 1994 වර්ෂයේදී රාජ්‍ය අයවැය කටයුතු අනුව සමස්ත අයවැය හිඟය (දීමනාවලට පෙර) රුපියල් දශලක්ෂ 57,730 වූ අතර, එය 1993 වර්ෂය හා සැසඳීමේදී රුපියල් දශලක්ෂ 43,121 විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව අයවැය හිඟය 1993 පැවති සියයට 8.4 සිට 1994 වර්ෂයේදී සියයට 10.0 දක්වා වැඩි විය. 1993 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 34,096 ක් වූ (දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 6.9) අය වැය හිඟය සමග සසඳන කළ 1994 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 8,257 (දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 1.4)ක් වූ විදේශ දීමනා උපයෝජනය කරගත්පසු දේශීය හා විදේශීය ණය ගැනීම් මගින් මූල්‍යනය කරන ලද අයවැය හිඟය (දීමනාවලට පසු) රුපියල් දශලක්ෂ 49,474 (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.5) ක් විය. රාජ්‍ය ආයෝජන වියදමින් සියයට 41පමණක් සහනදායි විදේශ ණය ලැබීම් වූ රුපියල් දශලක්ෂ 11,778 (දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 2.0) සහ ව්‍යාපෘති ප්‍රදානයන් යටතේ ලැබුණු රුපියල් දශලක්ෂ 4,797 මගින් සිදු කළ දේශීය වශයෙන් ණය ලබා ගැනීම් ප්‍රාග්ධන ව්‍යාපෘතීන් සඳහා වූ ඉහළ දේශිය සම්පත් ඉක්මවා යමින් 1994 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 37,696 (දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 6.5)ක් වූ අතර, 1993 වර්ෂය සැසඳීමේදී එය රුපියල් දශලක්ෂ 24,241 (දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව 4.9) විය. එම වැඩිවීම කෙරෙහි 1994 වර්ෂයේදී වර්තන ගිණුමෙහි පැවති ඉහල හිඟය හේතු විය. වර්තන ගිණුමෙහි සිදු වූ මෙම අයහපත් වර්ධනය නිසා බැංකු නොවන ප්‍රභවයන්ගෙන් සිදු කරන ලද රුපියල් දශලක්ෂ 36,539 වූ ණය ගැනීම් වලට අමතරව බැංකු අංශයෙන්ද රුපියල් දශලක්ෂ 1,157 ක් ණයට ගැනිමට සිදුවිය. මෙවැනි ඉහළ ණයගැනීම් මගින් අයවැය හිඟය පියවීම නිසා පුද්ගලික අංශයේ ආයෝජනයන් සඳහා ලබාගත හැකිව තිබූ සම්පත් අඩුවිමක් පමණක් නොව සාර්ව ආර්ථික කළමනාකරණයෙහි දුර්වල කිරීමක් ද සිදු කරනු ලැබීය. එමනිසා, පසුගිය වසර පහ තුළ, රජයේ අයවැය හිඟය පියවීමේ කටයුතු සම්පූර්ණයෙන්ම බැංකු නොවන මූලයයන් කෙරෙහි බලාපොරොත්තුවෙන් කරනු ලැබුවද, මූල්‍ය සමස්ථයන්ගේ දැනටමත් පවතින ඉහළ ප්‍රසාරණය තවදුරටත් වැඩි කිරීමට බලපෑම් කරමින් 1994 වසරේදී අයවැය කටයුතු සඳහා බැංකු අංශයේ ද පිහිට ලබා ගනිමින් එම අංශයෙන් ද ණය ලබාගැනීමට සිදුවිය මෙමගින් රජයේ ආයෝජන ඉහළ මට්ටමක පවත්වාගනිමින් රජයේ ණය ගැනීම් අඩු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය කටයුතු වලින් ජනනය වන වර්තන ගිණුම් හිඟය ඉවත් කිරීමට දැරිය යුතු ප්‍රයත්නය අවධාරණය කර ඇත. 1990-1994 කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය කටයුතු වල සම්පිණ්ඩිත සටහන 1.58 යටතේ දක්වා ඇත.

**ආදායම**

1994 වර්ෂයේ රජයේ මුළු ආදායම සියයට 12 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 110,038 ක්වූ අතර, පසුගිය වර්ෂයේ එම වැඩිවීම සියයට 15 ක් විය. මුළු ආදායමින් බදු ආදායමට හිමි කොටස 1993 දී පැවති සියයට 87 සිට 1994 දී සියයට 90 දක්වා වැඩි වූ අතර, බදු ආදායම් ව්‍යුහය තුළ භාණ්ඩ හා සේවා මත අය කරනු ලබන බදු සඳහා වන ආදායමේ වැදගත්කම

## 1.59 සංඛ්‍යා සටහන
## රජයේ ආදායම් සංයුතියෙහි සම්පිණ්ඩනය

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 අනුමතකළ ඇස්තමේන්තු | 1994 තාවකාලික | 1995 අනුමතකළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| බදු ආදායම | 61,206 | 68,157 | 76,353 | 85,891 | 105,276 | 99,417 | 121,324 |
| ආදායම් බදු | 7,337 | 9,722 | 10,967 | 12,543 | 15,781 | 15,277 | 15,420 |
| පෞද්ගලික | 2,957 | 3,539 | 4,067 | 5,235 | 5,504 | 5,621 | 5,270 |
| සාමූහික | 4,380 | 6,183 | 6,900 | 7,308 | 10,277 | 9,656 | 10,150 |
| දේපල මත බදු | 3,140 | 3,541 | 3,597 | 3,493 | 4,191 | 4,386 | 4,667 |
| මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සඳහා බදු | 2,618 | 3,033 | 1,991 | 1,073 | 540 | 471 | - |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 28,770 | 32,107 | 38,158 | 47,963 | 58,364 | 56,685 | 72.495 |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු | 20,291 | 21,430 | 24,095 | 29,663 | 35,401 | 32,300 | 39,005 |
| නිෂ්පාදන | 6,798 | 7,945 | 8,262 | 9,231 | 11,518 | 9,171 | 11,380 |
| නිෂ්පාදන නොවන | 3,726 | 2,974 | 3,546 | 4,825 | 4,134 | 6,445 | 8,180 |
| ආනයන | 9,767 | 10,511 | 12,287 | 15,607 | 19,749 | 16,684 | 19,445 |
| සුරාබදු | 8,170 | 10,597 | 10,232 | 11,655 | 13,929 | 14,632 | 20,339 |
| මත්පැන් | 2,657 | 3,126 | 3,434 | 4,063 | 5,013 | 4,686 | 5.410 |
| දුම්කොළ | 5,461 | 6,884 | 5,573 | 6,866 | 7,148 | 7,888 | 10,232 |
| වෙනත් | 52 | 587 | 1,225 | 726 | 1,768 | 2,058 | 4,697 |
| ආරක්ෂක බද්ද | - | - | 3,764 | 6,589 | 8,759 | 9,693 | 10,887 |
| බලපත්‍ර ගාස්තු | 309 | 80 | 67 | 56 | 275 | 60 | 2,264 |
| ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු | 19,341 | 19,754 | 21,640 | 20,819 | 26,400 | 22,598 | 28,742 |
| ආනයන | 16,792 | 18,617 | 20,819 | 20,762 | 26,400 | 22,598 | 28,742 |
| අපනයන | 2,549 | 1,137 | 821 | 57 | - | - | - |
| තේ | 1,601 | 492 | 360 | 23 | - | - | - |
| ඉන් වටිනාකම අනුව | 1,311 | 298 | 226 | - | - | - | - |
| රබර් | 747 | 476 | 318 | 16 | - | - | - |
| පොල් | 151 | 125 | 117 | 4 | - | - | - |
| අනෙකුත් අපනයන | 50 | 44 | 26 | 14 | - | - | - |
| බදු නොවන ආදායම | 6,758 | 8,022 | 9,428 | 12,448 | 10,358 | 10,621 | 15,786 |
| දේපල ආදායම | 4,192 | 5,964 | 6,262 | 8,154 | 6,879 | 7,459 | 10,622 |
| ඉන් : මහ බැංකුවේ ලාභ | 500 | 500 | 1,150 | 1,000 | 1,000 | 1,200 | 1,200 |
| පොළී ආදායම | 1,143 | 2,617 | 3,596 | 4,390 | 4,406 | 4,560 | 5,635 |
| වෙළඳ ව්‍යවසායයන්ගේ අතිරික්තය | 2,235 | 2,612 | 1,179 | - | - | - | - |
| සේවා හා ගාස්තු | 835 | 917 | 1,225 | 1,303 | 1,490 | 1,430 | 2,409 |
| අනෙකුත් බදු නොවන ආදායම් | 1,731 | 1,141 | 1,941 | 2,991 | 1,989 | 1,732 | 2,755 |
| මුළු ආදායම | 67,964 | 76,179 | 85,781 | 98,339 | 115,634 | 110,038 | 137,110 |

(අ) බැංකු ප්‍රතිව්‍යුහකරණය කිරීම සඳහා නිකුත් කරන ලද බැඳුම්කර මත පැනවූ රඳවාගැනීමේ බද්ද ද ඇතුළත්ය.

## 1.59 සංඛ්‍යා සටහන (සම්බන්ධයි)

# රජයේ ආදායම් සංයුතියෙහි සම්පිණ්ඩනය
## (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 අනුමතකළ ඇස්තමේන්තු | 1994 තාවකාලික | 1995 අනුමතකළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| බදු ආදායම | 19.0 | 18.3 | 17.9 | 17.2 | 18.5 | 17.2 | 18.4 |
| ආදායම් බදු | 2.3 | 2.6 | 2.6 | 2.5 | 2.8 | 2.6 | 2.3 |
| පෞද්ගලික | 0.9 | 0.9 | 1.0 | 1.0 | 1.0 | 1.0 | 0.8 |
| සාමූහික | 1.4 | 1.7 | 1.6 | 1.5 | 1.8 | 1.7 | 1.5 |
| දේපල මත බදු | 1.0 | 1.0 | 0.8 | 0.7 | 0.7 | 0.8 | 0.7 |
| මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සඳහා බදු | 0.8 | 0.8 | 0.5 | 0.2 | 0.1 | 0.1 | - |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 8.9 | 8.6 | 9.0 | 9.6 | 10.3 | 9.8 | 11.0 |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු | 6.3 | 5.8 | 5.7 | 5.9 | 6.2 | 5.6 | 5.9 |
| නිෂ්පාදන | 2.1 | 2.1 | 1.9 | 1.8 | 2.0 | 1.6 | 1.7 |
| නිෂ්පාදන නොවන | 1.2 | 0.8 | 0.8 | 1.0 | 0.7 | 1.1 | 1.2 |
| ආනයන | 3.0 | 2.8 | 2.9 | 3.1 | 3.5 | 2.9 | 2.9 |
| සුරාබදු | 2.5 | 2.8 | 2.4 | 2.3 | 2.4 | 2.5 | 3.0 |
| මත්පැන් | 0.8 | 0.8 | 0.8 | 0.8 | 0.9 | 0.8 | 0.8 |
| දුම්කොල | 1.7 | 1.8 | 1.3 | 1.4 | 1.3 | 1.4 | 1.5 |
| වෙනත් | ... | 0.2 | 0.3 | 0.1 | 0.3 | 0.4 | 0.7 |
| ආරක්ෂක බද්ද | - | - | 0.9 | 1.3 | 1.5 | 1.7 | 1.6 |
| බලපත්‍ර ගාස්තු | 0.1 | ... | ... | ... | ... | ... | 0.3 |
| ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු | 6.0 | 5.3 | 5.1 | 4.2 | 4.6 | 3.9 | 4.4 |
| ආනයන | 5.2 | 5.0 | 4.9 | 4.2 | 4.6 | 3.9 | 4.4 |
| අපනයන | 0.8 | 0.3 | 0.2 | ... | - | - | - |
| තේ | 0.5 | 0.1 | 0.1 | ... | - | - | - |
| ඉන් වටිනාකම අනුව | 0.4 | 0.1 | 0.1 | ... | - | - | - |
| රබර් | 0.2 | 0.1 | 0.1 | ... | - | - | - |
| පොල් | ... | ... | ... | ... | - | - | - |
| අනෙකුත් අපනයන | ... | ... | ... | ... | - | - | - |
| බදු නොවන ආදායම | 2.1 | 2.2 | 2.2 | 2.5 | 1.8 | 1.8 | 2.4 |
| දේපල ආදායම | 1.3 | 1.6 | 1.5 | 1.6 | 1.2 | 1.3 | 1.6 |
| ඉන් : මහ බැංකුවේ ලාභ | 0.2 | 0.1 | 0.3 | 0.2 | 0.2 | 0.2 | 0.2 |
| පොළී ආදායම් | 0.4 | 0.7 | 0.8 | 0.7 | 0.8 | 0.8 | 0.9 |
| වෙළඳ ව්‍යවසායන්ගේ අතිරික්තය | 0.7 | 0.7 | 0.3 | - | - | - | - |
| සේවා හා ගාස්තු | 0.3 | 0.2 | 0.3 | 0.3 | 0.3 | 0.2 | 0.4 |
| අනෙකුත් බදු නොවන ආදායම් | 0.5 | 0.3 | 0.5 | 0.6 | 0.3 | 0.3 | 0.4 |
| මුළු ආදායම | 21.1 | 20.4 | 20.2 | 19.7 | 20.3 | 19.0 | 20.8 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

තවදුරටත් වැඩි වී මුළු බදු ආදායමෙහි එම ආදායමේ ප්‍රතිශතය 1993 පැවති සියයට 56 සිට 1994 දී සියයට 57 දක්වා වැඩි විය. ආරක්ෂක බද්ද සහ සුරා බදු යටතේ රැස්කරන ලද ආදායමේ වැඩිවීම ඉහත ආදායම් වැඩිවීම තවදුරටත් ශක්තිමත් කරන ලදි. ආනයනය මත අය කරනු ලබන බදු ආදායම සියයට 9 ක නාමික වැඩිවීමක් පෙන්නුම් කළ ද මුළු බදු ආදායමට අනුපාතිකව 1992 පැවති සියයට 27 සිට 1993 දී සියයට 24 දක්වා ද, 1994 දී තවදුරටත් සියයට 23 දක්වා, ද පහත වැටුණ අතර, එම අඩුවීම භාණ්ඩ විශාල සංඛ්‍යාවක් සඳහා බදු නිදහස් කිරීම් නිසා බදු පදනම බාදනය වීමේ ප්‍රතිඵලයකි. මේ අතර, 1994 අප්‍රේල් මස සිට උපරිම ආදායම් බදු අනුපාතය සියයට 40 සිට සියයට 35 දක්වා අඩු කළ ද ආදායම් බදු ආදායම සියයට 22 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, මුළු ආදායමට එම බදු ආදායම දරණ ප්‍රතිශතය 1993 පැවති සියයට 13 සිට 1994 දී සියයට 14 දක්වා වැඩි විය.

බදු නොවන ආදායම පසුගිය වර්ෂයට වඩා සියයට 15 ක අඩුවීමක් සටහන් කරමින් රුපියල් දශලක්ෂ 10,621 ක් විය. බදු නොවන ආදායමින් සියයට 43 පමණ පොළී ආදායම් වූ අතර, සියයට 37 ක පමණ ප්‍රමාණයක් මහ බැංකුවේ ලාභ, වෙනත් ලාභ හා ලාභාංශ මූල්‍ය නීති පනත යටතේ ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතන මගින් උත්පාදිත බදු සහ ගාස්තු ආදායම් මගින් 1994 වර්ෂයේදී රැස්කර ගන්නා ලදී.

## බදු ආදායම

බදු ව්‍යුහයෙහි භාණ්ඩ සහ සේවා මත අය කරනු ලබන බදු ආදායමේ කැපී පෙනෙන වැඩිවීම පිළිබිඹු කරමින් භාණ්ඩ හා සේවා මත අය කරනු ලැබූ ආදායම 1994 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 56,685 (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.8) වූ අතර එය 1993 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 47,963 (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.6) විය. ආරක්ෂක බදු ආදායම සහ 'සේවාවන් මත වූ පිරිවැටුම් බදු වල කැපීපෙනෙන වැඩිවීම සඳහා නිෂ්පාදන බදු යටතේ බදු අය කරනු ලැබූ භාණ්ඩ ප්‍රමාණය වැඩි කිරීමත් සිගරට් මත අය කරන ලද නිෂ්පාදන බදු වැඩි කිරීමත් දායක විය.

ආරක්ෂක බද්ද අපනයනයන් හැර අනෙකුත් සියළුම භාණ්ඩ හා සේවා මත අය කරන ලද අතර, එමගින් ජනනය කරන ලද ආදායම සියයට 47 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 9,693ක් විය. මෙම ආදායමේ වැඩිවීමට එම බදු රැස් කිරීමේ පරිපාලනමය පහසුවට අමතරව පුළුල් බදු පදනමක් මත පැනවූ තනි බදු අනුපාතයකින් යුතු ආරක්ෂක බදු ප්‍රතිශතය 1994 ජනවාරි මස සිට සියයට 3 සිට සියයට 3.5 දක්වා වැඩි කිරීම සහ බදු පදනම ශීඝ්‍රයෙන් පුළුල 'වීම යන කරුණු දෙකම හේතු විය. රජයේ ආදායම් රැස් කිරීමේ කාර්යයේදී මෙම බදු ක්‍රමය බහුවිධ බදු අනුපාතයන් සහ පටු බදු පදනමක් ඇති වෙනත් බදු වලට වඩා බදුරැස්කිරීමේ ප්‍රයත්නයේදී ස්ථිරසාර තත්ත්වයක පවතින බව මින් පෙනේ.

පසුගිය වර්ෂයේ පිරිවැටුම් බදු ආදායමේ සියයට 23 ක වැඩිවීම හා සැසඳීමේදී 1994 දී එම ආදායම සියයට 9 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 32,300 ක් විය. පිරිවැටුම් බදුවල මන්දගාමී වර්ධනයට හේතුවූයේ නිෂ්පාදන කටයුතු සඳහා වන පිරිවැටුම් බදු සියයට 1 කින් පහත වැටීම සහ ආනයන මත අය කරන ලද පිරිවැටුම් බදු රැස්කිරීම් වල වූ මන්දගාමී භාවයයි. නිෂ්පාදන වටිනාකම සහ ආනයනයන්හි වටිනාකම වැඩිවූවද, 1994 වර්ෂයේදී පිරිවැටුම් බදු සඳහා සිදු කරන ලද විවිධ බදු නිදහස් කිරීම් නිසා කාර්යයන් මත කරන ලද පිරිවැටුම් බදු රැස්කිරීම්වල සතුටුදායක තත්ත්වයන් නොපැවතුණි. කෙසේ වුවද විශේෂයෙන්ම බැංකු සහ මූල්‍ය සේවා, වරාය, විදුලිය සහ විදුලි සංදේශ වැනි සේවා අංශයන්ගේ කටයුතුවල සිදුවූ විශාල ප්‍රසාරණය නිසා නිෂ්පාදන නොවන කටයුතු සඳහා වූ පිරිවැටුම් බදු සියයට 34 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 6,445ක් වූ අතර, පෙර වර්ෂයේ මෙම වැඩිවීම සියයට 36 ක් විය.

1994 වර්ෂයේදී සුරා සහ නිෂ්පාදන බදු යටතේ රැස්කර ගන්නා ලද ආදායම සියයට 26 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 14,632 ක්වූ අතර, පෙර වර්ෂයේ මෙම වැඩිවීම සියයට 14 ක් විය. මත්පැන් අලෙවියෙහි සිදු වූ වැඩිවීම හේතුකොටගෙන මත්පැන් මත අය කරන ලද සුරාබදු ආදායම සියයට 15 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 4,686 ක්වූ අතර, 1994 මාර්තු මස සිට සිදු

කරන ලද සිගරට් මත අය කරනු ලබන නිෂ්පාදන බදු ප්‍රතිශතය සිගරට් 1000 සඳහා වූ රු. 525 සිට රු.700 දක්වා වැඩි කිරීම බොහෝදුරට හේතු කොටගෙන සැකසූ දුම්කොළ සහ සිගරට් මත රැස් කරන ලද බදු ආදායම සියයට 14.9 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 7,888 ක්විය. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන ) පනත යටතේ වූ රෙදි සෝදන යන්ත්‍ර, වායුසමීකරණ යන්ත්‍ර, විදුලි පංකා, විදුලි උපකරණ ආදියෙහි නිෂ්පාදන බදු ප්‍රතිශතය වැඩිකිරීම සහ වෙනත් කල් පවතින පරිභෝගික භාණ්ඩ කීපයක් මෙම නිෂ්පාදන බදු යටතට පත් කිරීම 1993 ඔක්තෝබර් මස හඳුන්වාදුන් පෙට්‍රල් මත අය කරනු ලබන බද්දෙහි පූර්ණ බලපෑම හේතුකොට ගෙන, නිෂ්පාදනබදු මගින් රුපියල් දශලක්ෂ 2,058ක ආදායමක් රැස්කර ගැනීමට හැකි වූ අතර, 1993 වර්ෂයේදී එම ආදායම රුපියල් දශලක්ෂ 726 ක් විය. විශේෂයෙන්ම 1990 ට පෙර ප්‍රාථමික භාණ්ඩ අපනයනයන් ඉහල අපනයන හා රේගු බදු වලට යටත්ව පැවති අවධියෙහි ශක්තිමත් බදු ප්‍රභවයක් නිර්මානය කළ ජාත්‍යන්තර වෙළඳම ආශ්‍රිත බදුවල සිට බදු ආදායමෙහි වැඩි වීමේ වැදගත් කම යටපත් කරන ලදී.

1994 වර්ෂයේදී ආනයනයන්ගේ මුළු වටිනාකම සියයට 22 ක් වැඩි වුවද රේගු බදු යටතේ ආදායම් රැස්කිරීම් සියයට 8.5 කින් පමණක් වැඩි වී රුපියල් දශලක්ෂ 22,598 ක් විය. මේ අනුව සාමාන්‍ය ආනයන බදු අනුපාතය එනම් මුළු ආනයන බදු ආදායම මුළු ආනයන වටිනාකමට දරණ අනුපාතය, 1993 දී පැවති සියයට 10.8 සිට 1994 දී සියයට 9.6 දක්වා අඩුවිය. මෙම සාමාන්‍ය ආනයන බදු අනුපාතය 1991 පැවති සියයට 14.7 සිට 1992 දී සියයට 13.6 දක්වා අඩුවිය. මෙම සාමාන්‍ය ආනයන බදු අනුපාතයේ අඩුවීම මෑත වර්ෂ වලදී ආනයන බදු වල ක්‍රමාණුකූලව සිදු කරන ලද පහත දැමීම හා සමානුපාත වුවද ආනයන බදු ආදායමේ තියුණු අඩුවීමට හේතු වූයේ භාණ්ඩ විශාල ප්‍රමාණයක් සඳහා බදු අය කිරීම ඉවත් කිරීම සහ අපනයන කර්මාන්ත සහ ආයෝජන සංවර්ධන මණ්ඩලය යටතේ ඇති කර්මාන්ත සඳහා 1994 වර්ෂය තුළදී ලබාදී තිබූ විවිධ බදු සහනයන් වේ. එමනිසා, ආනයන වටිනාකම 1993 පැවති රුපියල් දශලක්ෂ 193,550 සිට 1994 දී රුපියල් දශලක්ෂ 236,030 දක්වා වැඩිවුවද, බදු අය කළ හැකි මුළු ආනයනයන්හි වටිනාකම 1993 පැවති රුපියල් දශලක්ෂ 86,455 සිට 1994 දී රුපියල් දශලක්ෂ 98,871 දක්වා සුළු වැඩිවීමක් පමණක් පෙන්නුම් කරන ලදී..

සාමාන්‍ය ආනයන බදු ප්‍රමාණයෙහි අඩුවීම කෙරෙහි ආනයන ව්‍යුහයෙහි සිදුවූ වෙනස ද එක් හේතුවක් විය. 1994 වර්ෂයේදී අඩු ආනයන බදු සහිත ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 33 කින් වැඩිවී මුළු ආනයන වටිනාකමින් සියයට 29 ක් නියෝජනය කළ අතර, 1993 වර්ෂයේදී එය සියයට 26 ක් විය. තවදුරටත් රුපියල් දශලක්ෂ 119,970 වූ අන්තර් මාධ්‍ය භාණ්ඩ වටිනාකමින් සියයට 50 ක් පමණ අයත් වූයේ ආනයන බදු අය නොකරන රෙදි, පොහොර සහ තිරිඟු සඳහා වේ. 1993 නොවැම්බර් මස දී වාහන, මත්පැන්, සහ දුම්කොළ හැර අනෙක් භාණ්ඩ සඳහා වූ ආනයන බදු ව්‍යුහය බදු අනුපාත 4 ක් එනම් සියයට 10, 20,35, සහ 45 ලෙස නිවැරදි කරන ලද නමුත් බදු අත් හැරීම්, බදු සහන ලබාදීම සහ 1994 මැද සිට සියයට 5 ක් වූ නව බදු අනුපාතයක් හඳුන්වාදීම නිසා එම කටයුතු ආනයන බදු පදනම ඛාදනය කිරීම කෙරෙහි හේතු වූ අතර, එමගින් වෙළෙඳ ප්‍රතිපත්ති සහ රේගු බදු ආදායම් අරමුනු යන කරුණු දෙකම පීඩාවට පත් කරන ලදි. තෝරා ගත් භාණ්ඩ සඳහා සියයට 5 ක බදු ප්‍රතිශතයක් ඇති කිරීමේ අදහස වූයේ එම භාණ්ඩ ආනයනයේදී අය කරනු ලබන පිරිවැටුම් බදු වලින් නිදහස් කිරීමයි.

ආදායම් බදු සැලකීමේදී, උපරිම ආදායම බදු ප්‍රතිශතය 1993 පැවති සියයට 50 සිට 1994 දී සියයට 35 දක්වා අඩු කළ ද, එම බදු ආදායම මෑත කාලයේදී ස්ථාවර ආදායම් මාර්ගයක් ලෙස පැවතුන අතර, එම ස්ථාවර භාවය තවදුරටත් පවත්වාගෙන යමින් ආදායම් බදු ආදායම සියයට 22 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 15,277 වූ අතර, 1993 දී එම වැඩිවීම සියයට 14 විය. 1994 මැයි මස උපයන විට බදු සඳහා නිදහස් ආදායම් සීමාව ඉහළ නැංවුවද, පෞද්ගලික ආදායම් බදු ආදායම සියයට 7 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 5,621 ක්වූ අතර, ඒ සඳහා පුද්ගලික අංශයේ සේවකයින්ගේ වැටුප් වැඩිවීම සහ බැංකු තැන්පතු සඳහා ගෙවන ලද පොලී ආදායම් වැඩිවීම හේතුවිය. පොළී ආදායම් මත පුද්ගලයින්ගෙන් රැස් කරගන්නා ලද බදු ආදායම විශාල ලෙස බැංකු තැන්පතු මත පැනවුණු රඳවා ගන්නා ලද බදු මගින් ලබා ගන්නා ලදී. මේ අතරම, සාමූහික ආදායම් බදු අය කිරීමේ උපරිම ප්‍රතිශතය 1993 පැවති සියයට 40 සිට 1994 දී සියයට 35 දක්වා පහත දැමුව ද සාමූහික ආදායම් බදු ආදායම සියයට 32 කින් වැඩිවී රුපියල් දශලක්ෂ

9,656 ක්වූ අතර, මීට ප්‍රධාන ලෙස 1994 වර්ෂයේ දී සාමූහික අංශයේ සටහන් වූ ඉහළ ලාභදායීත්වය සහ විශාල සාමූහික බදු ලිපි ගොනු පරිගණක ගත කිරීම මගින් සිදු කරන ලද බදු පරිපාලනයේ දියුණුව හේතු විය.

1994 වර්ෂයේදී මුද්දර බදු මගින් ලැබූ ආදායම සියයට 26 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 4,386 ක්වූ අතර, මෙම වැඩිවීමට ප්‍රධාන ලෙස ආනයන මත විවෘත කරන ලද ණයවර ලිපි සඳහා අය කරනු ලැබූ මුද්දර බදු හේතු විය. ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගයෙහි සිදුවූ අඩුවීම නිසා භාණ්ඩාගාර බිල්පත් මත අය කරනු ලැබූ බදු ආදායම රුපියල් දශලක්ෂ 471 දක්වා අඩු වූ අතර, එය 1993 දී රුපියල් දශලක්ෂ 1,073ක් විය. රජයේ ආදායම පිළිබඳ සම්පිණ්ඩිත සටහන 1.59 යටතේ දක්වා ඇත.

## විදේශ ප්‍රදානයන්

1994 වර්ෂයේදී අයවැය කටයුතු සඳහා උපයෝජනය කළ විදේශ ප්‍රදානයන් සියයට 3 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 8,257 වූ අතර, පෙර වර්ෂයේ දී මෙම ප්‍රදානයන්හි සියයට 3 ක පහත වැටීමක් සිදුවිය. කෙසේ වුවද, දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව විදේශීය ප්‍රදානයන් ප්‍රමාණය 1993 දී සියයට 1.6 සිට 1994 දී සියයට 1.4 දක්වා අඩු විය. රාජ්‍ය ආයෝජන කටයුතු සඳහා ව්‍යාපෘති දීමනා ලෙස ලැබුණු මුළු විදේශ ප්‍රදානයන් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 4,797 ක් විය.

## වියදම

1993 වර්ෂයට වඩා සියයට 19 ක වැඩිවීමක් වාර්තා කරමින් රජයේ මුළු වියදම 1994 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 167,768 ක් වූ අතර, පසුගිය වර්ෂයේදී එම වැඩිවීම සියයට 20 ක් විය. 1994 රුපියල් දශලක්ෂ 127,084 ක් වූ වර්තන වියදම මුළු රජයේ වියදමට අනුපාතිකව සියයට 76 ක්වූ අතර, පෙර වර්ෂයේ දි එය සියයට 73 ක් විය. මේ අතර, රජයේ ආයෝජන රුපියල් දශලක්ෂ 40,455 (මින් විශාල වියදමක් යටිතල පහසුකම් සඳහා වූ ව්‍යාපෘති වෙනුවෙනි.) වූ අතර, එය දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සැලකීමේදී 1993 පැවති සියයට 8 සිට 1994 වර්ෂයේදී සියයට 7 දක්වා පහත වැටීමක් පෙන්නුම් කරයි.

## වර්තන වියදම

1993 වර්ෂයේ පැවති වර්තන වියදමෙහි සියයට 14 ක වැඩිවීම හා සැසඳීමේදී 1994 වර්ෂයේ වර්තන වියදම සියයට 24 ක තියුණු වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 127,084 ක් විය. වැටුප්, ප්‍රවාහන කටයුතු, සැපයුම් සහ අවශ්‍ය දේ සඳහා සිදු කරන ලද මුළු වියදම සියයට 22 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 54,700 (මින් සියයට 50ක් පමණ ආරක්ෂක කටයුතු සඳහා වැය විය.) ක්ව පැවතිණි. පෙර වර්ෂය හා සැසඳීමේදී එය සියයට 13 ක වැඩිවීමක් වූ අතර, එම වැඩිවීම ආරක්ෂක වියදමේ සහ පොදු පරිපාලනමය කටයුතු සඳහා වූ වියදමෙහි වැඩිවීම නිසා සිදු විය. අයවැය හිඟයෙහි නොකඩවා පැවති පුළුල්වීම හා එහි ප්‍රතිඵලයක් ලෙස සිදු කරන ලද ණයගැනීම් පිළිබිඹු කරමින් රාජ්‍ය ණය සඳහා කරන ලද පොළී ගෙවීම් රුපියල් දශලක්ෂ 38,031ක් විය. ඉන් සියයට 86 දේශීය ණය සඳහා වූ පොළී ගෙවීම් වන අතර, එය 1994 වසරේදී සියයට 26 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. විශ්‍රාම වැටුප් සඳහා වූ අධික වියදම හා විවිධ සහනාධාර වැඩ සටහන්වලට කරන ලද අධික වියදම්හි සිදුවූ ප්‍රසාරණයෙහි බලපෑම සහ විශේෂයෙන්ම 1994 මැයි මස ප්‍රකාශයට පත් කරන ලද සහනයන් හේතු කොටගෙන විශ්‍රාම වැටුප් සහ සහනාධාර වැඩසටහන්වල වියදම්ද ඇතුළත්ව කුටුම්භයනට කරන ලද මුළු පැවරුම් වියදම සියයට 27 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 28,263 ක් විය.

1993 හා 1994 වර්ෂයන් හිදී අදියර කිහිපයකින් ක්‍රියාත්මක කොට රාජ්‍ය අංශයෙහි සියළුම සේවකයන්ට 1993 ලබාදෙන ලද 30% වැටුප් වැඩිකිරීමේ මුළු බලපෑම සහ මැයි දින සහනයන් යටතේ තාවකාලික රැකියා නියුක්තියන් ස්ථිර කිරීම යන කරුණු හේතුකොට ගෙන පෞද්ගලික පඩිනඩි සඳහා වූ මුළු වියදම පසුගිය වර්ෂයේ සිදුවූ සියයට 27 ක වැඩිවීම තවදුරටත් සියයට 11 කින් වැඩිකරමින් රුපියල් දශලක්ෂ 29,309 ක් විය. දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව මෙම වියදම සියයට 5 ක් පමණ විය. රාජ්‍ය අංශයේ ආදායම් තවදුරටත් වැඩි කිරීම සඳහා පවතින සීමිත අවකාශය නිසා අනාගතයේදී රාජ්‍ය අංශයේ රැකියා නියුක්තිකයින් සංඛ්‍යාව තවදුරටත් වැඩිකිරීම සහ රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීම යන කටයුතු වලට සමගාමී ලෙස රාජ්‍ය අංශයේ දැනට සිටින සේවකයින් සංඛ්‍යාවේ අඩු කිරීමක් සිදු නොවුනහොත් එම කටයුතු නොනවත්වා පවත්වාගෙන යෑමට නොහැකි වනු ඇත.

## 1.60 සංඛ්‍යා සටහන
## ආර්ථික වර්ගීකරණයට අනුව වියදම සහ ණයදීම

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 අනුමතකළ ඇස්තමේන්තු | 1994 තාවකාලික | 1995 අනුමතකළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| වර්තන වියදම | 71,771 | 83,756 | 89,638 | 102,288 | 109,367 | 127,084 | 133,424 |
| භාණ්ඩ හා සේවා සඳහා වියදම | 30,167 | 35,848 | 39,691 | 44,895 | 47,936 | 54,700 | 55,280 |
| වැටුප් හා වේතන | 15,748 | 17,985 | 20,793 | 26,332 | 27,851 | 29,309 | 32,898 |
| වෙනත් භාණ්ඩ හා සේවා | 14,419 | 17,863 | 18,898 | 18,563 | 20,085 | 25,391 | 22,382 |
| පොළී ගෙවීම් | 20,668 | 22,073 | 25,940 | 30,203 | 33,862 | 38,031 | 37,204 |
| විදේශීය | 3,678 | 4,113 | 4,739 | 5,102 | 5,904 | 5,511 | 6,361 |
| දේශීය | 16,990 | 17,960 | 21,201 | 25,101 | 27,958 | 32,520 | 30,843 |
| වර්තන පැවැරුම් සහ සහනාධාර | 20,936 | 25,835 | 24,007 | 27,190 | 27,570 | 34,353 | 40,940 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 2,639 | 1,743 | 1,428 | 1,571 | 2,196 | 2,634 | 7,757 |
| රාජ්‍ය ආයතනයන්ට | 1,811 | 1,405 | 1,649 | 2,031 | 2,360 | 1,976 | 2,360 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 1,237 | 1,050 | 1,111 | 896 | 1,060 | 1,307 | 1,250 |
| කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 15,249 | 21,637 | 19,819 | 22,335 | 21,954 | 28,263 | 29,305 |
| ආහාර මුද්දර, ආහාර සහනාධාර | 5,122 | 4,023 | 4,466 | 4,580 | 3,609 | 4,654 | 4,750 |
| ජනසවිය | 2,912 | 3,407 | 3,098 | 3,685 | 3,906 | 5,369 | 4,600 |
| විශ්‍රාම වැටුප් | 4,490 | 8,832 | 8,099 | 10,516 | 10,877 | 13,271 | 14,394 |
| පොහොර සහනාධාර | - | - | - | - | - | 630 | 1,500 |
| වෙනත් | 2,725 | 5,375 | 4,156 | 3,554 | 3,562 | 4,339 | 4,061 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | - | - | - |
| ප්‍රාග්ධන වියදම | 19,529 | 25,305 | 24,949 | 33,662 | 35,233 | 30,391 | 42,668 |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 12,025 | 14,072 | 12,604 | 19,719 | 20,595 | 16,747 | 24,894 |
| ප්‍රාග්ධන පැවැරුම් | 7,504 | 11,233 | 12,345 | 13,943 | 14,638 | 13,644 | 17,774 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 1,249 | 2,993 | 4,610 | 4,311 | 4,139 | 4,246 | 5,230 |
| රාජ්‍ය ආයතනයන්ට | 5,303 | 6,990 | 6,663 | 8,551 | 9,673 | 8,433 | 11,383 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 843 | 950 | 1,028 | 1,036 | 708 | 914 | 1,112 |
| වෙනත් | 109 | 300 | 44 | 45 | 118 | 51 | 49 |
| ආපසු ගෙවීම් අඩුකල පසු ණය දීම | 8,514 | 10,467 | 2,386 | 4,510 | 9,619 | 10,293 | 10,503 |
| අත්තිකාරම් ගිණුම් | 1,699 | 1,819 | -150 | 410 | 250 | 2,462 | 500 |
| ණය දීම | 7,219 | 7,286 | 6,246 | 6,265 | 12,013 | 10,064 | 13,761 |
| ප්‍රතිව්‍යුහකරණ පිරිවැය | - | 3,335 | 1,750 | 1,465 | 3,392 | 3,739 | 3,392 |
| පෞද්ගලීකරණ ලැබීම් | - | -841 | -2,850 | -1,200 | -3,000 | -2,996 | -4,500 |
| ණය ආපසු ගෙවීම් | -404 | -1,132 | -2,610 | -2,430 | -3,036 | -2,976 | -2,650 |
| මුළු වියදම් සහ ශුද්ධ ණයදීම | 99,814 | 119,528 | 116,973 | 140,460 | 154,220 | 167,768 | 186,595 |

## 1.60 සංඛ්‍යා සටහන (සම්බන්ධයි)

# ආර්ථික වර්ගීකරණයට අනුව වියදම සහ ශුද්ධ ණයදීම (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 අනුමතකළ ඇස්තමේන්තු | 1994 තාවකාලික | 1995 අනුමතකළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| වර්තන වියදම | 22.3 | 22.5 | 21.1 | 20.5 | 19.2 | 22.0 | 20.2 |
| භාණ්ඩ හා සේවා සඳහා වියදම | 9.4 | 9.6 | 9.3 | 9.0 | 8.4 | 9.5 | 8.4 |
| වැටුප් හා වේතන | 4.9 | 4.8 | 4.9 | 5.3 | 4.9 | 5.1 | 5.0 |
| වෙනත් භාණ්ඩ හා සේවා | 4.5 | 4.8 | 4.4 | 3.7 | 3.5 | 4.4 | 3.4 |
| පොළී ගෙවීම් | 6.4 | 5.9 | 6.1 | 6.0 | 6.0 | 6.6 | 5.7 |
| විදේශීය | 1.1 | 1.1 | 1.1 | 1.0 | 1.0 | 1.0 | 1.0 |
| දේශීය | 5.3 | 4.8 | 5.0 | 5.0 | 4.9 | 5.6 | 4.7 |
| වර්තන පැවැරුම් සහ සහනාධාර | 6.5 | 6.9 | 5.6 | 5.4 | 4.8 | 5.9 | 6.2 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 0.8 | 0.5 | 0.3 | 0.3 | 0.4 | 0.5 | 1.2 |
| රාජ්‍ය ආයතනයන්ට | 0.6 | 0.4 | 0.4 | 0.4 | 0.4 | 0.3 | 0.4 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 0.4 | 0.3 | 0.3 | 0.2 | 0.2 | 0.2 | 0.2 |
| කටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 4.7 | 5.8 | 4.7 | 4.5 | 3.9 | 4.9 | 4.4 |
| ආහාර මුද්දර, ආහාර සහනාධාර | 1.6 | 1.1 | 1.0 | 0.9 | 0.6 | 0.8 | 0.7 |
| ජනසවිය | 0.9 | 0.9 | 0.7 | 0.7 | 0.7 | 0.9 | 0.7 |
| විශ්‍රාම වැටුප් | 1.4 | 2.4 | 1.9 | 2.1 | 1.9 | 2.3 | 2.2 |
| පොහොර සහනාධාර | - | - | - | - | - | 0.1 | 0.2 |
| වෙනත් | 0.8 | 1.4 | 1.0 | 0.8 | 0.6 | 0.8 | 0.6 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | - | - | - |
| ප්‍රාග්ධන වියදම | 6.1 | 6.8 | 5.9 | 6.7 | 6.2 | 5.3 | 6.5 |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 3.7 | 3.8 | 3.0 | 3.9 | 3.6 | 2.9 | 3.8 |
| ප්‍රග්ධන පැවැරුම් | 2.3 | 3.0 | 2.9 | 2.8 | 2.6 | 2.4 | 2.7 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 0.4 | 0.8 | 1.1 | 0.9 | 0.7 | 0.7 | 0.8 |
| රාජ්‍ය ආයතනයන්ට | 1.6 | 1.9 | 1.6 | 1.7 | 1.7 | 1.5 | 1.8 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 0.3 | 0.3 | 0.2 | 0.2 | 0.1 | 0.2 | 0.2 |
| වෙනත් | - | 0.1 | - | - | - | - | - |
| ආපසු ගෙවීම් අඩුකල පසු ණය දීම | 2.6 | 2.8 | 0.6 | 0.9 | 1.7 | 1.8 | 1.6 |
| ඉන් අත්තිකාරම් ගිණුම් | 0.5 | 0.5 | ... | 01 | ... | ... | ... |
| මුළු වියදම් සහ ශුද්ධ ණයදීම | 31.0 | 32.1 | 27.5 | 28.1 | 27.1 | 29.0 | 28.3 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.61 සංඛ්‍යා සටහන
# කාර්යයන් අනුව වියදමෙහි වර්ගීකරණය

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 අනුමතකළ ඇස්තමේන්තු | 1994 තාවකාලික | 1995 අනුමතකළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** | | | | | | | |
| සාමාන්‍ය පොදු සේවා | 17,942 | 19,811 | 24,453 | 27,564 | 27,214 | 30,444 | 33,049 |
| සිවිල් පරිපාලනය | 6,622 | 5,612 | 7,099 | 7,405 | 8,517 | 4,637 | 10,182 |
| ආරක්ෂක කටයුතු | 6,736 | 10,317 | 12,876 | 15,413 | 13,351 | 19,415 | 16,750 |
| පොදු නීතිය හා ආරක්ෂාව | 4,585 | 3,882 | 4,478 | 4,746 | 5,346 | 6.392 | 6,118 |
| සමාජ සේවා | 24,449 | 31,594 | 32,700 | 37,477 | 39,604 | 47,656 | 53,032 |
| අධ්‍යාපනය | 8,529 | 7,951 | 10,533 | 11,225 | 12,355 | 14,836 | 12,732 |
| සෞඛ්‍යය | 3,685 | 4,110 | 4,518 | 5,711 | 6,471 | 7,666 | 8,627 |
| ශුභසාධන | 11,973 | 19,266 | 17,378 | 20,255 | 20,250 | 24,560 | 30,926 |
| නිවාස | - | - | - | - | - | - | - |
| ප්‍රජා සේවා | 262 | 267 | 271 | 285 | 528 | 593 | 747 |
| ආර්ථික සේවා | 5,137 | 3,925 | 3,834 | 4,328 | 5,590 | 6,195 | 7,173 |
| කෘෂිකර්මය හා වාරිමාර්ග | 982 | 912 | 1,398 | 1,483 | 2,017 | 2,506 | 2,968 |
| ධීවර | 46 | 98 | 68 | 107 | 83 | 99 | 133 |
| නිෂ්පාදනය සහ කැනීම් | 181 | 231 | 349 | 403 | 356 | 351 | 651 |
| බලශක්ති සහ ජල සම්පාදනය | 345 | 659 | 133 | 93 | 297 | 518 | 997 |
| ප්‍රවාහන සහ සන්නිවේදනය | 2,600 | 1,308 | 1,208 | 1,346 | 1,944 | 2,024 | 1,517 |
| වෙළඳාම සහ වාණිජ්‍යය | 159 | 137 | 232 | 203 | 158 | 72 | 105 |
| වෙනත් | 824 | 580 | 446 | 693 | 735 | 625 | 802 |
| අනෙකුත් | 24,241 | 28,425 | 28,652 | 32,920 | 36,961 | 42,789 | 40,170 |
| ඉන් : පොලී ගෙවීම් | 20,668 | 22,073 | 25,940 | 30,203 | 33.862 | 38,031 | 37,204 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | - | - | - |
| **මුළු වර්තන වියදම** | 71,770 | 83,756 | 89,639 | 102,288 | 109,367 | 127,084 | 133,424 |
| **ප්‍රාග්ධන වියදම සහ ණය දීම** | | | | | | | |
| සාමාන්‍ය පොදු සේවා | 3,617 | 2,422 | 1,970 | 4,085 | 3,522 | 2,390 | 5,006 |
| සිවිල් පරිපාලනය | 1,599 | 1,680 | 1,256 | 3,463 | 2,719 | 1,753 | 3,626 |
| පොදු නීතිය හා ආරක්ෂාව | 2,018 | 742 | 714 | 622 | 803 | 637 | 1,380 |
| සමාජ සේවා | 3,019 | 2,964 | 6,137 | 6,075 | 8,056 | 7,677 | 11,140 |
| අධ්‍යාපනය | 1,042 | 1,178 | 2,008 | 2,845 | 3,014 | 2,877 | 4,126 |
| සෞඛ්‍යය | 1,279 | 1,119 | 2,023 | 1,353 | 2,460 | 1,519 | 3,075 |
| ශුභසාධන | 25 | 15 | 1,191 | 1,084 | 1,289 | 1,681 | 289 |
| නිවාස | 513 | 535 | 767 | 604 | 1,070 | 802 | 2,099 |
| ප්‍රජා සේවා | 160 | 117 | 148 | 189 | 223 | 798 | 1,551 |
| ආර්ථික සේවා | 18,798 | 26,022 | 20,444 | 29,600 | 34,844 | 29,304 | 40,148 |
| කෘෂිකර්මය හා වාරිමාර්ග | 5,215 | 6,071 | 5,890 | 5,682 | 5,308 | 5,179 | 6,171 |
| ඉන් : මහවැලි යෝජනා ක්‍රමය | 1,810 | 2,410 | 2,670 | 2,810 | 2,504 | 2,598 | 2,764 |
| ධීවර | 133 | 181 | 175 | 124 | 381 | 368 | 189 |
| නිෂ්පාදනය සහ කැනීම් | 120 | 171 | 184 | 1,471 | 72 | 22 | 273 |
| බලශක්ති සහ ජල සම්පාදනය | 6,132 | 6,181 | 5,527 | 4,728 | 7,831 | 5,518 | 7,884 |
| ප්‍රවාහන සහ සන්නිවේදනය | 4,319 | 10,921 | 4,363 | 10,165 | 15,923 | 14,522 | 18,639 |
| වෙළඳාම සහ වාණිජ්‍යය | 205 | 218 | 365 | 364 | 413 | 182 | 427 |
| වෙනත් | 2,674 | 2,279 | 3,940 | 7,066 | 4,916 | 3,513 | 6,565 |
| අනෙකුත් | 952 | 1,250 | 1,072 | 1,081 | 826 | 1,084 | 1,161 |
| **මුළු ප්‍රාග්ධන වියදම හා ණයදීම** | 26,387 | 32,658 | 29,622 | 40,841 | 47,247 | 40,455 | 57,455 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

දෛනික පදනම අනුව සිදුවන අරමුදල් වල හිඟය නිසා ඌන වියදම් සහිත තත්ත්වයක් ඇති වි තිබියදීත් වැටුප් නොවන කටයුතු සඳහා සිදු කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත අයවැය ප්‍රතිපාදනයන් සිදු කිරීමට නොහැකි අපහසුතා නොකඩවා පැවතීමෙන් එහි අවසාන ප්‍රතිඵලය ලෙස වැටුප් නොවන කටයුතු සඳහා වන වියදම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 25,391 ක් වූ ඉහළ අගයක පැවතුනි. මෙම වියදම සියයට 37 ක වැඩිවීමක් පෙන්නුම් කරන අතර, එම වැඩිවීම කෙරෙහි ආරක්ෂක හා ආරක්ෂක අංශයනට සම්බන්ධ කටයුතු සඳහා වූ ඉහළ වියදම සහ මැතිවරණ කටයුතු මධ්‍යයේ රාජ්‍ය මූල්‍ය අංශයේ සිදු වූ විනය අඩුවීම හේතු විය. වෙනත් අංශයන්හි වියදම් අඩුකිරීම සඳහා ඇති සීමිත ඉඩකඩ යටතේ ඉහත කටයුතු සඳහා වන වියදම් පාලනය කර ගැනිම වර්තන වියදමේ සිදුවන වැඩිවීම වලක්වා ගැනීම කෙරෙහි වැදගත් වනු ඇත.

රජයේ ණය සඳහා කරන ලද පොළී ගෙවීම් 1994 වර්ෂයේදී සියයට 26 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 38,031 වූ අතර, පසුගිය වසර හා සැසඳීමේදී එම වැඩිවීම සියයට 16 ක් විය. 1994 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 300,174 වූ නොපියවූ විදේශ ණය විශාල ප්‍රමාණයක් පැවතුණද, විදේශ ණය සඳහා වූ පොළී වියදම රුපියල් දශලක්ෂ 5511 ක්වූ අතර, ශ්‍රී ලංකා විදේශ ණය වල ඉහළ සහනදායි තත්ත්වය පිළිබිඹු කරමින් එම පොළී වියදම සියයට 8 ක සාමන්‍ය වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. මෙම ණය සඳහා වූ සාමාන්‍ය පොළී අනුපාතය සියයට 1.8 ක් පමණ වූ අතර, වාණිජ ණය සඳහා අය කරන ලද වෙළෙඳ පොළ ප්‍රතිශතයනට වඩා එය ඉතා පහළ අගයක පවතී. මීට ප්‍රතිවිරුද්ධ ලෙස දේශීය ණය සඳහා කරන ලද මුළු පොළී ගෙවීම් සියයට 30ක් වැනි විශාල ප්‍රමාණයකින් වැඩිවී රුපියල් දශලක්ෂ 32,520 ක් වූ අතර , එහි ප්‍රතිඵලයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව එම පොළී ගෙවීම් 1993 පැවති සියයට 5.0 සිට 1994 දී සියයට 5.6 දක්වා වැඩි විය. දේශීය ණය සඳහා පොළී වියදම් මුළු දේශීය ණය ප්‍රමාණයට දරණ අනුපාතය හෙවත් සාමාන්‍ය පොළී අනුපාතිකය 1994 දී සියයට 13 ක් වූ අතර, මෙය 1993 වර්ෂය හා සැසඳීමේදී සියයට 12 ක් විය.

දේශීය ණය සඳහා වූ පොළී වියදම් වැඩිවීම කෙටිකාලීන (භාණ්ඩාගාර බිල්පත්) සහ මධ්‍ය හා දිගුකාලීන (රුපියල් සුරැකුම්පත්) ණය වල වැඩිවීම මගින් පැහැදිලි කළ හැකි වේ. භාණ්ඩාගාර බිල්පත් සඳහා ගෙවනු ලැබූ වාර්ෂික වෙළෙඳපොළ පොළී අනුපාතිකය 1993 පැවති සියයට 17.82-21.98 සිට 1994 දී සියයට 12.00 -19.36 දක්වා වූ පරාසයකට අඩුවීම හා නොපියවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 97,196 සිට රුපියල් දශලක්ෂ 98,896 දක්වා ආන්තික ලෙස වැඩිවීමක් සිදු වුවද භාණ්ඩාගාර බිල්පත් සඳහා කරන ලද පොළී වියදම සියයට 38 වැනි සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩිවී රුපියල් දශලක්ෂ 17,916 බවට පත්විය. විවට වෙළෙඳ පොළ කටයුතු හේතුවෙන් 1993 දි භාණ්ඩාගාර බිල්පත් මත ඉහළ පොළී අනුපාත පැවතිම මෙයට හේතු විය. මේ නිසා සාමාන්‍ය පොළී අනුපාතය එනම් පොළී ගෙවීම් නොපියවූ මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයට දරණ අනුපාතය, 1993 පැවති සියයට 13.3 සිට 1994 දී සියයට 18.1 දක්වා වැඩිවිය. මේ අතර, රුපියල් ණය සඳහා ගෙවන ලද පොළී වියදම ද 1993 පැවති රුපියල් දශලක්ෂ 11,739 සිට රුපියල් දශලක්ෂ 16,680 දක්වා වැඩි වූ අතර, එම වැඩිවීම කෙරෙහි රුපියල් ණය වැඩ සටහන යටතේ කරන ලද ණය ගැනීම් වැඩිවීම සහ කෙටිකාලීන ණය උපකරණ සඳහා වූ ඉහළ පොළී ප්‍රතිශත අනුගමනය කරමින් පසුගිය වර්ෂ දෙක තුළදී රුපියල් ණය සඳහා ගෙවන ලද පොළී ප්‍රතිශතය සියයට 15.0 -18.5 දක්වා වූ පරාසයකට වැඩිවීම ද හේතු විය. 1994 වර්ෂයේදී එකතු කරන ලද මුළු රුපියල් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 46,878 කින් වැඩි වූ අතර, එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී රුපියල් දශලක්ෂ 28,205 ක් විය. රුපියල් ණය සඳහා ගෙවනු ලබන පොළිය අර්ධ වාර්ෂිකව සිදු කරන බැවින් 1994 දෙවන භාගය තුළදී කරන ලද රුපියල් ණය ගැනීම් වල පොළී වියදම 1995 පොළී වියදමට ඇතුළත්ව ඇත.

දේශීය ණය සඳහා ගෙවනු ලබන ඉහළ පොළී වියදම කරුණු කීපයක් නිසා අවධානයට ලක් කළ යුතුව ඇත.පළමුව, එම පොළී වියදම මුළු වර්තන වියදමෙන් හතරෙන් එකක් හා රජයේ ආදායමෙන් සියයට 30 ක් වන අතර, එය රාජ්‍ය මූල්‍ය පාලනය කෙරෙහි දැඩි පීඩාකාරී තත්ත්වයක් ඇති කරනු ලැබේ. දෙවනුව, ඉහළ පොළී වියදම විශේෂයෙන්ම විවිධ වැඩ සටහන් යටතේ සිදු කරනු ලබන නිෂ්පාදනමය රාජ්‍ය වියදම් වැනි රජයේ වෙනත් වියදම් පීඩාවට පත් කෙරෙන අතර, එමගින් රාජ්‍ය අංශයේ එම කටයුතු සඳහා වන සහභාගීත්වය දැඩි ලෙස අඩුවිමක් සිදුවිය හැක. තෙවනුව , තරඟකාරී වෙළෙඳ පොළක් පැවතීම සහ රජයේ ණය උපකරණ වෙළෙඳපොළෙහි

අලෙවි කිරීම යටතේ පෙර පැවති පරිපාලනමය පොළී අනුපාතය යටතේ ණය රැස් කිරීමේදීට වඩා රාජ්‍ය ණය සඳහා ගෙවන පොළී වියදම ඉහළ මට්ටමක පැවතීම සිදුවිය හැක. මෙම තත්ත්වය යටතේ, රාජ්‍ය මූල්‍ය කටයුතුවල පවතින ව්‍යුහාත්මක අසමතුලිතතාවය නිවැරදි කිරීම සඳහා රාජ්‍ය ණය ගැනීම් අඩු කිරීමට යම් සම්මත ක්‍රියාදමයක් හඳුන්වාදීම අවශ්‍යව ඇත.

1994 වර්ෂයේ මුළු සංක්‍රාම ගෙවීම් සියයට 26 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 34,353 ක් වූ අතර, පසුගිය වර්ෂය හා සැසඳීමේදී එම වැඩිවීම සියයට 14 ක් විය. මේ අනුව දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සංක්‍රාම ගෙවීම් 1993 පැවති සියයට 5.4 සිට 1994 දී සියයට 5.9 දක්වා වැඩි විය. මෙම සංක්‍රාම ගෙවීම් වල වැඩිවීම කෙරෙහි විශාල ලෙස විශ්‍රාම වැටුප් හි තියුණු වැඩිවීම හේතු වූ අතර, එය 1993 පැවති රුපියල් දශලක්ෂ 10,516 සිට 1994 දී රුපියල් දශලක්ෂ 13,271 දක්වා වැඩි විය. 1994 දී විශ්‍රාම වැටුප් වල සිදු වූ සියයට 26 ක වැඩිවීම 1993 දි සිදුවූ සියයට 30 ක වැඩිවීම සමඟ සැසඳීමේදී, එම වැඩිවීම කෙරෙහි 1993 සිට සිදු කරන ලද රුපියල් 260 ක මාසික ජීවන වියදම් දීමනාවෙහි වර්ෂය පුරා සිදු වූ මුළු බලපෑම, මැයි දින සහන සැලසීම් යටතේ විශ්‍රාම ගෙවීම් වල සිදු වූ විෂමතා නිවැරදි කිරීම් සමඟ කරන ලද හිඟ වැටුප් ගෙවීම් සහ 1988 සිට නවත්වා තිබූ ජීවන වියදම් දීමනාව එම නොගෙවූ ඉතිරිය සමඟම ගෙවීමට රජය ගන්නා ලද තීරණය යන කරුණු සියල්ලම හේතු විය. මේ අතර, ජීවිත අපේක්ෂාව වැඩිවීම සහ සෑම වසරකම විශාල සංඛ්‍යාවක් විශ්‍රාම ගැනීම හේතුකොටගෙන මුළු විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව 1993 පැවති 319,000 සිට 1994 දී 330,000 දක්වා වැඩි විය. නව විශ්‍රාමික වැඩ සටහන යටතේ 1990 දී සිදු කරන ලද විශ්‍රාම ගැනීමේ ප්‍රතිලාභ වැඩි කිරීමද රජයේ විශ්‍රාම වැටුප් වියදම් වැඩිවීම කෙරෙහි හේතු විය. 1990 සහ 1994 කාල පරිච්ඡේදය තුළදී රජයේ විශ්‍රාම වැටුප් වියදම තුන් ගුණයකින් පමණ වැඩිවී ඇති අතර, එම වැඩිවීම රජයේ විශ්‍රාම වැඩපිළිවෙළෙහි දිගුකාලීන ලෙස සිදු කළ යුතු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාවය පෙන්නුම් කරයි.

මේ අතර, රජයේ ප්‍රධාන සහනාධාර වැඩ සටහන් තුන වන ආහාර සහ භූමිතෙල් මුද්දර සහනාධාර පාසැල් දිවා ආහාර හා නිළ ඇඳුම් සැපයීම සහ ජනසවිය වැඩ සටහන සඳහා 1994 වසරේදී රුපියල් දශලක්ෂ 10,355 ක් වියදම් කරන ලද අතර, 1993 වසර හා සැසඳීමේදී මෙය රුපියල් දශලක්ෂ 8,441 විය. දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව එම වියදම සියයට 1.7 සිට සියයට 1.8 දක්වා වැඩි විය. ආහාර සහ භූමිතෙල් මුද්දර සහනාධාරය සඳහා වූ වියදම සියයට 3 කින් අඩුවුවද, ජනසවිය සහ පාසැල් දිවා ආහාර හා නිළ ඇඳුම් වැඩසටහන සඳහා කරන ලද වියදම 1994 මැයි මස මෙම වැඩසටහන් පුළුල් කිරීම සඳහා රජය විසින් කරන ලද තීරණය නිසා සියයට 35 ක් වැනි සැලකිය යුතු ප්‍රතිශතයකින් වැඩි විය. නව රජය විසින් 1994 ඔක්තෝම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද සියයට 30 ක පොහොර සහනාධාරය යටතේ එම අවසාන මාස 3 සඳහා වූ වියදම රුපියල් දශලක්ෂ 630 විය. වෙනත් කුටුම්භ සඳහා කරන ලද සංක්‍රාමයන් වන උතුරු සහ නැගෙනහිර පලාත්හි සරණාගතයන් සඳහා කරන ලද ගෙවීම්, පාසැල් වාර ප්‍රවේශ පත්‍ර සහ නොමිළයේ පාසැල් පොත් සැපයීම සඳහා වන වියදම් රුපියල් දශලක්ෂ 4,637 වූ අතර, පෙර වර්ෂයේ එය රුපියල් දශලක්ෂ 3,378 ක් විය.

කාර්යයන් අනුව වර්ගීකරණයට පදනම්ව, අධ්‍යාපනය, සෞඛ්‍ය, සුභසාධනය, නිවාස සහ ප්‍රජා සේවා අයත් සමාජ සේවා කටයුතු සඳහා කරන ලද වියදම සියයට 27 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 47,656 විය. මෙම වැඩිවීම විශාල ලෙස පාසැල් දිවා ආහාර වියදමෙහි වැඩිවීම, ජනසවිය වැඩ සටහනෙහි ප්‍රසාරනය සහ විශ්‍රාම වැටුප් සඳහා දෙන ලද ගෙවීම්හි සිදුවූ තියුණු වැඩිවීම බලපා ඇති බව දැකිය හැක. රාජ්‍ය සම්පත් බෙදීමේදී මෙලෙස සුභසාධන වියදම් සඳහා ඇති නැඹුරුව හේතුකොට ගෙන දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සමාජ සේවා කටයුතු සඳහා කරන ලද වියදම 1993 පැවති සියයට 7.5 සිට 1994 දී සියයට 8.2 දක්වා වැඩි විය. සිවිල් පරිපාලනය සහ ආරක්ෂක කටයුතු සඳහා කරන ලද වර්තන වියදම සියයට 10 ක වැඩිවීමක් සටහන් කරමින් රුපියල් දශලක්ෂ 30,444 ක්වූ අතර, එම වැඩිවීම කෙරෙහි ආරක්ෂක හා ආරක්ෂක කටයුතු වලට සම්බන්ධ කටයුතු සඳහා කරන ලද වියදම 1993 පැවති රුපියල් දශලක්ෂ 20,159 (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.5) දක්වා වූ තියුණු වැඩිවීම බොහෝදුරට හේතු විය.මේ අතර, කෘෂිකර්මය සහ වාරිමාර්ග, ධීවර, ප්‍රවාහන, වෙළෙඳාම සහ වාණිජ්‍යය සහ නිෂ්පාදකයින් සඳහා දෙන ලද සහනාධාර යනාදිය ඇතුළත් ආර්ථික සේවා කටයුතු සිදු කිරීම සහ එම කටයුතු නඩත්තු කිරීම සඳහා කරන ලද වර්තන වියදම සියයට 43 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 6195ක්

වූ අතර, එම වැඩිවීම කෙරෙහි 1994 සැප්තැම්බර් මස ප්‍රදානය කරන ලද පොහොර සහනාධාරය බොහෝදුරට හේතු විය. කාර්යයන් අනුව රජයේ වියදම සංඛ්‍යා සටහන 1.61 දක්වා ඇත.

## ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණයදීම්

1994 වර්ෂය තුළදී කරන ලද ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් රුපියල් දශලක්ෂ 40,684ක් වූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 7.0 ක් විය. 1993 වර්ෂයේදී එම වියදම රුපියල් දශලක්ෂ 38,172 ක්වූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 7.6 ක් විය. මුළු රාජ්‍ය ආයෝජන ප්‍රමාණය 1994 දී රුපියල් දශලක්ෂ 40,455 (දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 7.0) වූ අතර, එය 1993 දී පැවති රුපියල් දශලක්ෂ 39,927 (දළ දේශීය නිෂ්පාදියට අනුපාතිකව සියයට 8.0) හා සැසඳිය හැක. රජයේ වෙනත් ශුද්ධ වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 229 ක්වූ අතර ඒ සඳහා අන්තිකාරම් ගිණුම මගින් විශාල ලෙස සිදු කරන ලද ණය දීම් (රුපියල් දශලක්ෂ 2,462 ) සහ රාජ්‍ය බැංකු දෙක සහ වෙනත් ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ වියදම් (රුපියල් දශලක්ෂ 3,739) සහ පෞද්ගලිකරණ වැඩ සටහන (රුපියල් දශලක්ෂ 2,996) සහ වාණිජමය රාජ්‍ය ආයතන සඳහා කරන ලද ණය දීම් සඳහා කරනු ලබන ආපසු ගෙවීම් (රුපියල් දශලක්ෂ 2,976) යනාදියෙන් ලැබුණු ආදයම් සියල්ලෙහිම ශුද්ධ බලපෑම හේතුවිය.

රාජ්‍ය ආයෝජන වැඩසටහන යටතේ ප්‍රාග්ධන දේපල ගොඩ නැංවීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා අදල අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් සෘජුවම සිදු කරන ලද ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය 1993 පැවති රුපියල් දශලක්ෂ 19,719 සිට 1994 වර්ෂයේදි රුපියල් දශලක්ෂ 16,747 ක් විය. ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සංස්ථා විසින් සිදු කරන ලද රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සඳහා රුපියල් දශලක්ෂ 13,644 ක් වැය කරන ලද අතර එය පසුගිය වර්ෂයේ භාවිතා කරන ලද මුදල හා සැසීමේදි තරමක පහත වැටීමක් පෙන්නුම් කරයි. මේ අතර ලංකා විදුලිබල මණ්ඩලය (ලං .වි. ම. ), ශ්‍රී ලංකා වරාය අධිකාරිය වැනි රජයේ වාණිජ ආයතනවල රාජ්‍ය ආයෝජන සඳහා කරන ලද ණය දිම් සඳහා අයවැය ප්‍රතිපාදනයන් රුපියල් දශලක්ෂ 12,031 ලෙස පැවතුනද ඒ සඳහා දරන ලද වියදම රුපියල් දශලක්ෂ 10,064 ක් විය.

ප්‍රාග්ධන වියදම් සහ ණය දීම් කාර්යයන් අනුව වර්ගිකරණය කළ විට ආර්ථික යටිතල පහසුකම් සැපයීම සඳහා කරන ලද මුළු රාජ්‍ය ආයෝජන ප්‍රමාණය, 1994 දි රුපියල් දශලක්ෂ 29,304 (දළ දේශිය නිෂ්පාදිතයට. අනුපාතිකව සියයට 5.1) ක්වූ අතර 1993 දි එය රුපියල් දශලක්ෂ 29,600 (දළ දේශිය .නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 5.9) විය. රාජ්‍ය ආයෝජන වලදී යටිතල පහසුකම් සඳහා කරන ලද ඉහළ ආයෝජනය පිළිබිඹු කරමින් ආර්ථික යටිතල පහසුකම් සඳහා කරන ලද වියදම ආසන්න ලෙස සියයට 72 ක් පමණ විය. බලශක්ති සහ ජල සැපයුම් සහ ජල ප්‍රවාහන සහ වරාය සේවා සඳහා කරන ලද රාජ්‍ය ආයෝජනවල සැළකියයුතු වැඩිවීමක් වාර්තා විය. 1994 දී නිවාස සහ ප්‍රජා සේවා සඳහා වන යටිතල පහසුකම් ලබාදීම සඳහා කරන ලද රාජ්‍ය ආයෝජනයන්හිද වැඩිවීමක් දැකිය හැක. අධ්‍යාපනය හා සෞඛ්‍යය සඳහා කරන ලද ප්‍රාග්ධන වියදම් හි සියයට 4.7 වැනි තරමක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 4,396 ක් විය. මේ අනුව දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව එම වියදම 1993 පැවති සියයට 0.84 සිට 1994 දී සියයට 0.76 දක්වා අඩු විය.

රජයේ ආයෝජනයන් පහළ මට්ටමක පැවතීම සැලකිල්ලට ගතයුතු වැදගත් කරුණකි. මෑත වර්ෂ වලදී රාජ්‍ය ආයෝජන විශාල ලෙස අඩුවීමක් දැකිය හැක. දළ දේශිය නිෂ්පාදිතයට අනුපාතිකව රාජ්‍ය ආයෝජන 1989 පැවති සියයට 10.5 සිට 1994 දි සියයට 7.0 දක්වා පහළ වැටුණි. පසුගිය වර්ෂ පහ තුළ සිදු කරන ලද රාජ්‍ය ආයෝජනයන් දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 8.6 ක්වූ අතර එය ඊට පෙර වර්ෂ පහ තුළදී සියයට 13.5ක් විය. රාජ්‍ය ආයෝජනය මෙලෙස පහත මට්ටමක පැවතීම හේතු කිපයක් නිසා සිදුවිය. පළමුව 1989 සිට අයවැය හිගය පහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා සිදු කරන ලද රාජ්‍ය මූල්‍ය ගැලපීම් රාජ්‍ය ආයෝජන අඩු කරමින් සිදුකර ඇත. දෙවනුව, සංකීර්ණ ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමට සිදුවීම නිසා විදුලිය සහ විදුලි සංදේශ වැනි විදේශ මූල්‍යකරණයක් සහිත රාජ්‍ය ආයෝජන

ව්‍යාපෘතීන්හි ක්‍රියාත්මක කිරීමේ වේගය මන්දගාමී කළ අතර එය ඉහත ව්‍යාපෘති සඳහා ලැබුනු මූල්‍ය පහසුකම් සැළකිය යුතු ලෙස ඌණ උපයෝජනයට හේතු විය. තෙවනුව රජය මූල්‍ය පාලනයේදී දෛනික කටයුතු සඳහා වන වියදම් සපයා ගැනීමට ඇති අපහසුතා යටතේ, දේශීය සම්පත් විශාල ලෙස උපයෝජනය කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යාපන, සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රයන්හි ආයෝජන සඳහා නොකඩවා මූල්‍ය පහසුකම් ලබාදීමට ඇති නොහැකියාව නිසා ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයකට පත්වීමද සිදු විය. ව්‍යාපාති ක්‍රියාත්මක කිරීමේදි සැළකියුතු ලෙස සිදුවන මහ හැරීම් වැනි කරුණු හේතු කොට ගෙන ප්‍රතිපූරණය කළ යුතු විදේශ ආධාරවල සිදුවන අඩු වියදම් කිරීම් නිසා ඉහත තත්ත්වය තවදුරටත් සංකීර්ණ වී ඇත. සිව්වනුව, රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතිවල කටයුතු නිරීක්ෂණය කිරීම මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීමේදී පවතින පමාවීම් මහහැරීම සඳහා අවශ්‍ය පිලියම් යෙදීමෙහිද සැලකියුතු දුර්වලතාවයන් පවතී. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයෝජනයන් සඳහා ආධාර දෙන රටවලින් විශාල සහයෝගයක් ලැබෙන තත්ත්වයක් යටතේ සහනදායී විදේශ ආධාර වලින් සැළකියයුතු ප්‍රමාණයක් අහිමි වී යන නිසා මූලිකත්ව පදනමක් යටතේ ඉහත අඩුලුහුඩුකම් මඟ හරවා ගැනිමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වී ඇත.

පෞද්ගලීකරණ ලැබීම් ප්‍රමාණය 1994 වසරේදී රුපියල් දශලක්ෂ 2,996 ක් විය. මෙම ලැබීම් 1993 අවසානය හා 1994 මුල් කාලය අතර පෞද්ගලීකරණය කරන ලද පුත්තලම සිමෙන්ති සංස්ථාව වැනි ආයතන වලින් ලබා ගන්නා ලදී. කෙසේ වුවද මැතිවරණ අතර කාලයේදී සහ 1994 අගෝස්තු මස සිදුවූ නව ආණ්ඩුවක් බලයට පැමිණීම යන කරුණු හේතුකොටගෙන නොකඩවා කරගෙන යමින් පැවති පෞද්ගලීකරණ වැඩසටහනෙහි පසුබෑමක් 1994 වර්ෂය තුලදී සිදුවිය. මේ අතර රාජ්‍ය ආයතන විසින් රජයට කරන ලද ණය ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2,976 ක් විය. මෙම ණය ආපසු ගෙවීම් වලින් වැඩි ප්‍රමාණයක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරන ලදී.

මේ අතර රාජ්‍ය බැංකු දෙක ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන සඳහා නිකුත් කරනු ලැබූ බැඳුම්කර සඳහා පොළී ගෙවීම් සහ පෞද්ගලීකරණ වැඩසටහන යටතේ රාජ්‍ය අංශයේ ආයතනයන්හි සිදු කරන ලද ප්‍රතිව්‍යුහගතකිරීමේ වියදම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 3,739 ක් විය. අත්තිකාරම් ගිණුම මගින් සිදු කරන ලද ණය ලබාදීම් ද 1994 වසරේදී වැඩිවූ අතර එයට මැයි දින නිවේදනය කරන ලද සහනයන් යටතේ රජයේ සේවකයිනට රජය මගින් ණය ලබාදීමේ පහසුකම් ලිහිල් කිරීම සහ දුම්රිය දෙපාර්තමේන්තුව සහ පොදු ගබඩාව සඳහාඅත්තිකාරම් ගිණුම් මගින් සිදු කරන ලද ගෙවීම්ද හේතු විය. අත්තිකාරම් ගිණුම යටතේ කරන ලද ශුද්ධ ණයලබාදීම 1994 දී රුපියල් දශලක්ෂ 2,462 වූ අතර පෙර වර්ෂය හා සැසඳීමේදී එය රුපියල් දශලක්ෂ 410 විය.

## අයවැය හිගය පියවීම

1994 වර්ෂයෙහි අයවැය හිගය (විදේශ ප්‍රදානයන් හැර) රුපියල් දශලක්ෂ 49,473 ක්වූ අතර එය පෙර වර්ෂයේ පැවති හිගය වූ රුපියල් දශලක්ෂ 34,096 ට වඩා සියයට 45 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. දළ විදේශීය ණය ගැනීම් 1994 වර්ෂයේදී සියයට 15 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 19,384 වුවද, 1993 සිදු කරන ලද රුපියල් දශලක්ෂ 9,855 ක් වූ ශුද්ධ විදේශ ණය ගැනීම් හා සැසඳීමේදී 1994 දී ශුද්ධ විදේශ ණය ගැනීම රුපියල් දශලක්ෂ 11,778ක් විය. 1993 දී සිදු කරන ලද විදේශ ණයආපසු ගෙවීම් ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 6,984 සිට 1994 දී රුපියල් දශලක්ෂ 7606 දක්වා වැඩිවීම මෙයට හේතුවිය. දළ දේශිය නිෂ්පාදිතයට අනුපාතිකව විදේශ ණය ගැනීම පසුගිය වර්ෂයේ මෙන්ම මෙම වර්ෂයේදීද සියයට 2.0 ක් විය. රාජ්‍ය අයවැය කටයුතුවලදී විශේෂයෙන්ම වර්තන ගිණුම් කටයුතුවල පැවති විශාල සම්පත් පරතරය පිළිබිඹු කරමින් අයවැය හිගයට (විදේශ ප්‍රදානයන්ට පසුව) අනුපාතිකව විදේශ ණයගැනිම් 1993 පැවති සියයට 29 සිට 1994 දී සියයට 24 දක්වා අඩුවිය. මේ නිසා 1994 වර්ෂයේදී ශුද්ධ දේශීය ණය ගැනීම් අති විශාල ලෙස සියයට 56 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 37,696 ක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව දේශීය අංශයෙන් කරන ලද මූල්‍යකරණය 1993 පැවති සියයට 4.9 සිට 1994 දී සියයට 6.5 දක්වා වැඩි වූ අතර එය අයවැය මත තවදුරටත් ණය බර වැඩිකිරීමක් ලෙස පෙන්වා දිය හැක.

රුපියල් ණය යටතේ රැස් කරන ලද දළ ණය ප්‍රමාණය 1994 දී රුපියල් දශලක්ෂ 46,878 වූ අතර පෙර වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 28,205 ක් විය. කෙසේ වුවද රුපියල් දශලක්ෂ 14,956 වූ රුපියල් ණය ආපසු ගෙවීම් සැලකූ විට, රුපියල් ණය වැඩසටහන යටතේ කරන ලද ශුද්ධ ණය ලබාගැනීම රුපියල් දශලක්ෂ 31,922 වූ අතර පෙර වර්ෂයේ එය රුපියල් දශලක්ෂ7,974 ක් විය. පෙර වර්ෂවල මෙන්ම සේවක අර්ථසාධක අරමුදලෙහි අරමුදල් වලින් සියයට 95 කට වඩා මෙම රුපියල් සුරැකුම් මත ආයෝජනය කර ඇත. සේවක අර්ථසාධක අරමුදල මගින් රුපියල් සුරැකුම් මත කරන ලද දළ ආයෝජනය 1994 දී රුපියල් දශලක්ෂ 25,352 ක් වූ අතර 1993 සමග සැසඳීමේදී එය රුපියල් දශලක්ෂ 21,359 ක් විය. 1994 වර්ෂයේදී රුපියල් ණය සඳහා ගෙවන ලද ඉහළ පොළී අනුපාතිකයන් නිසා ජාතික ඉතිරිකිරීමේ බැංකුව ද භාණ්ඩාගාර බිල්පත්වල සිට රජයේ රුපියල් ණය කරා මාරු වෙමින් රුපියල් දශලක්ෂ 19,595 ක් දක්වා ප්‍රමාණයක් ආයෝජනය කිරීම සිදු කරන ලදී.

1994 වර්ෂයේදී රාජ්‍ය මූල්‍ය කටයුතුවල පැවති විශාල සම්පත් පරතරය යටතේ අයවැය හිඟය මූල්‍යකරණය සඳහා බැංකු අංශයන්ගෙන් ද ආධාර ලබා ගැනීමට රජයට සිදුවිය. ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ඇති රජයේ මුදල් ශේෂ රුපියල් දශලක්ෂ 1,011 කින් වර්ධනය වුවද, රුපියල් දශලක්ෂ 1,864 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ අත්තිකාරම් ගිණුම යටතේ භාවිතයට ගැනීම, භාණ්ඩාගාර බිල්පත් යටතේ සිදු කරන ලද රුපියල් දශලක්ෂ 1,145 ක ණය ගැනීම් සහ වෙනත් ගණුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස 1994 හි ශුද්ධ ණය ගැනීම රුපියල් දශලක්ෂ 1,157 ක්වූ අතර එය ආර්ථිකයේ සංචිත මුදල් (අධිබලැති මුදල්) ප්‍රමාණය ප්‍රසාරණය කිරීම සඳහා දයක විය.


කෙසේ වුවද වාණිජ බැංකු මගින් රජයට කරන ලද ශුද්ධ ණය දීම් රුපියල් දශලක්ෂ 605 ප්‍රමාණයකින් පහත වැටුන අතර ඊට හේතුව වූයේ 1994 දී වාණිජ බැංකු වලින් රජය රුපියල් දශලක්ෂ 2,381 ණය ප්‍රමාණයක් ලබා ගත්තද වාණිජ බැංකුවල පැවති රජයේ තැන්පතු ශේෂයන් රුපියල් දශලක්ෂ 2,986 දක්වා වැඩිවීමයි. රජයේ සුරැකුම්පත් ඉහළ පොළී අනුපාතිකයන් යටතේ නිකුත් කිරීම මගින් දේශීය ණය ගැනීම් අධික ලෙස සිදුකළද ශ්‍රී ලංකා මහ බැංකුව සහ වෙනත් වාණිජ බැංකුවල තැන්පතු ශේෂයන් රුපියල් දශලක්ෂ 3,997 දක්වා වැඩි වීම මගින් පැහැදිලි වන කරුණක් වන්නේ රජයේ අයවැය කටයුතුවල පවත්නා ඉහළ පොළී ගෙවීමේ දුෂ්කරතාවය අඩුකිරීම සඳහා රජයේ මූල්‍ය පාලනයෙහි තවදුරටත් වැඩි දියුණුවක් සිදු කිරීම අවශ්‍ය බව වේ.

## රාජ්‍ය ණය

1994 වර්ෂය අවසානයට පැවති නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය සියයට 14 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 549,292 විය. දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව 1994 අවසානයේ පැවති මුළු ණය අනුපාතය සියයට 95 වූ අතර 1993 දී එය සියයට 97 ක් විය. මුළු රාජ්‍ය ණය ප්‍රමාණයෙන් සියයට 45 වන මුළු දේශිය ණය ප්‍රමාණය 1993 දී රුපියල් දශලක්ෂ 213,685 ක්වූ අතර එය සියයට 17 කින් වැඩිවී 1994 අවසානයේදී රුපියල් දශලක්ෂ 249,118 ක් විය. විදේශීය ණය ප්‍රමාණය 1993 අවසානයට පැවති රුපියල් දශලක්ෂ 270,224 සිට සියයට 11 න් වැඩි වී රුපියල් දශලක්ෂ 300,174 ක් විය. දළ දේශීය නිෂ්පදිතයට අනුපාතිකව මුළු දේශීය ණය ප්‍රමාණය පෙර වර්ෂයේ මෙන්ම සියයට 43 ක්ව පැවතුනි. 1994 දෙසැම්බර් අවසානය වන විට මධ්‍ය හා දිගුකාලීන දේශීය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 28,552 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 140,392 ක්වූ අතර කෙටිකාලීන ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 6,881 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 108,726 දක්වා වූ අතර රජයේ ණයෙහි මැදි හා දිගුකාලීන ණය කෙරෙහි සිදුවී ඇති ව්‍යුහාත්මක විතැන්වීම ඉන් පිළිබිඹු කරනු ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස දිගුකාලීන රාජ්‍ය ණය ප්‍රමාණය මුළු රාජ්‍ය ණය ප්‍රමානයට දැරූ අනුපාතිකය 1993 පැවති සියයට 52 සිට 1994 දී සියයට 56 දක්වා වැඩි විය.

1994 වර්ෂය අවසානයට නොපියවූ විදේශීය ණය සඳහා වගකීම රුපියල් දශලක්ෂ 29,950 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 300,174 විය. කෙසේ වුවද රුපියල් දශලක්ෂ 18,172 කින් වැඩි වූ විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 61ක් විනිමය අනුපාතිකයෙහි සිදු වූ විචලනයෙහි බලපෑම නිසා සිදුවිය. මුළු රාජ්‍ය ණය ප්‍රමාණයට අනුපාතිකව විදේශීය ණය ප්‍රමාණය 1994 වර්ෂය අවසානයේදී සියයට 55 ක්වූ අතර එය 1993 දී ද පැවති මට්ටමම විය. 1994 වර්ෂය තුළදී

# රාජ්‍ය ණය සංයුතිය




* දළ රාජ්‍ය ණය වලින් නිදන් අරමුදල් අඩු කළ පසු.

ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.62 සංඛ්‍යා සටහන
## නොපියවූ රාජ්‍ය ණය (වසර අවසානයට)

රුපියල් දශලක්ෂ


| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 තාවකාලික |
|---|---|---|---|---|---|
| මුළු දේශීය ණය | 133,898 | 152,119 | 170,020 | 213,685 | 249,118 |
| කෙටි කාලීන | 74,376 | 84,412 | 97,924 | 101,845 | 108,726 |
| භාණ්ඩාගාර බිල්පත් | 67,968 | 72,968 | 84,996 | 91,343 | 96,360 |
| රුපියල් සුරැකුම්පත් | - | 4,000 | 4,000 | - | - |
| තාවකාලික අත්තිකාරම් | 6,408 | 7,444 | 8,928 | 10,502 | 12,366 |
| මැදි හා දිගකාලීන | 59,522 | 67,707 | 72,096 | 111,840 | 140,392 |
| රුපියල් සුරැකුම්පත් (අ) | 54,677 | 62,823 | 65,180 | 105,707 | 137,554 |
| භාණ්ඩාගාර බිල්පත් | - | - | 2,100 | 5,853 | 2,535 |
| ජාතික ආරක්ෂක බැඳුම්කර | 4,532 | 4,532 | 4,532 | - | - |
| භාණ්ඩාගාර තැන්පතු සහතික | 109 | 153 | 102 | 114 | 145 |
| බදු සංචිත සහතික පත්‍ර | 9 | 9 | 8 | 8 | 7 |
| වෙනත් | 195 | 190 | 174 | 158 | 151 |
| ණය උපකරණ අනුව | 133,898 | 152,120 | 170,020 | 213,685 | 249,118 |
| රුපියල් සුරැකුම්පත් | 54,676 | 66,823 | 69,180 | 105,707 | 137,554 |
| භාණ්ඩාගාර බිල්පත් | 67,968 | 72,968 | 87,096 | 97,196 | 98,896 |
| ජාතික ආරක්ෂක බැඳුම්කර | 4,532 | 4,532 | 4,532 | - | - |
| භාණ්ඩාගාර තැන්පතු සහතික | 109 | 153 | 102 | 114 | 145 |
| බදු සංචිත සහතික පත්‍ර | 9 | 9 | 8 | 8 | 7 |
| තාවකාලික අත්තිකාරම් | 6,408 | 7,444 | 8,928 | 10,502 | .2,366 |
| වෙනත් | 196 | 191 | 174 | 158 | 151 |
| ආයතන අනුව | 133,898 | 152,120 | 170,020 | 213,684 | 249,118 |
| බැංකු | 48,254 | 52,145 | 58,111 | 90,134 | 100,043 |
| මහ බැංකුව | | | | | |
| ණය උපකරණ අනුව | 37,080 | 42,486 | 34,932 | 16,480 | 21,345 |
| රුපියල් ණය | 18 | 10 | 6 | - | - |
| භාණ්ඩාගාර බිල්පත් | 30,654 | 35,032 | 25,998 | 5,978 | 8,979 |
| තාවකාලික අත්තිකාරම් | 6,408 | 7,444 | 8,928 | 10,502 | 12,366 |
| වෙළෙඳ බැංකු | | | | | |
| ණය උපකරණ අනුව | 11,175 | 9,659 | 23,179 | 73,654 | 78,698 |
| රුපියල් ණය | 565 | 414 | 413 | 24,088 | 24,840 |
| භාණ්ඩාගාර බිල්පත් | 10,604 | 9,239 | 22,760 | 49,566 | 53,858 |
| ජාතික ආරක්ෂක බැඳුම්කර | 5 | 5 | 5 | - | - |
| වෙනත් | 1 | 1 | 1 | - | - |
| ආයතන අනුව | 11,175 | 9,659 | 23,179 | 73,654 | 78,698 |
| ලංකා බැංකුව | 6,841 | 6,791 | 15,753 | 40,333 | 39,469 |
| මහජන බැංකුව | 2,062 | 2,182 | 2,938 | 15,690 | 18,363 |
| වෙනත් | 2,272 | 686 | 4,488 | 17,630 | 20,867 |
| නිදන් අරමුදල් | 1,662 | 840 | 359 | 239 | 137 |
| රුපියල් ණය | 1,662 | 840 | 359 | 239 | 137 |
| බැංකු නොවන අංශය | | | | | |
| ණය උපකරණ අනුව : | 83,982 | 99,134 | 111,550 | 123,311 | 148,938 |
| රුපියල් ණය | 52,432 | 65,559 | 68,402 | 81,379 | 112,577 |

| | | | | | |
|---|---|---|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 26,710 | 28,697 | 38,338 | 41,652 | 36,059 |
| ජාතික ආරක්ෂක බැඳුම්කර | 4,527 | 4,527 | 4,527 | - | - |
| භාණ්ඩාගාර තැන්පතු සහතික | 109 | 153 | 102 | 114 | 145 |
| බදු සංචිත සහතික පත් | 9 | 9 | 8 | 8 | 7 |
| වෙනත් | 195 | 190 | 173 | 158 | 151 |
| ආයතන අනුව : | 83,982 | 99,134 | 111,551 | 123,311 | 148,939 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 24,089 | 26,558 | 30,782 | 37,767 | 46,407 |
| ඉතිරි කිරීමේ ආයතන හා පුද්ගලයන් | 13,018 | 13,031 | 14,981 | 13,165 | 15,813 |
| සේ. අ. අරමුදල | 36,851 | 45,862 | 54,563 | 65,645 | 79,745 |
| රක්ෂණ ආයතන | 3,426 | 4,074 | 4,035 | 244 | 312 |
| මූල්‍ය සමාගම් | 1,446 | 2,427 | 3,131 | 5,868 | 5,942 |
| වෙනත් | 5,153 | 7,182 | 4,060 | 622 | 720 |
| දෙපාර්තමේන්තු සහ තිල අරමුදල් | 62 | 34 | 428 | 453 | 556 |
| විදේශීය පරිපාලන ණය | 195 | 190 | 174 | 158 | 151 |
| **මුළු විදේශීය ණය** | 176,883 | 214,579 | 235,538 | 270,224 | 300,174 |
| ස්වරූපය අනුව : | 176,883 | 214,579 | 235,538 | 270,224 | 300,174 |
| ව්‍යාපෘති ණය | 132,338 | 166,149 | 185,003 | 216,355 | 244,819 |
| ව්‍යාපෘති නොවන ණය | 44,545 | 48,430 | 50,536 | 53,869 | 55,355 |
| භාණ්ඩ ණය | 43,393 | 46,037 | 48,550 | 52,120 | 53,727 |
| වෙනත් | 1,152 | 2,393 | 1,986 | 1,749 | 1,629 |
| ආයතන අනුව : | 176,883 | 214,579 | 235,538 | 270,224 | 300,174 |
| සහනදායි ණය | 166,202 | 202,554 | 225,132 | 260,557 | 291,437 |
| බහු පාර්ශ්වීය | 59,526 | 78,084 | 91,067 | 109,283 | 122,852 |
| ද්වි පාර්ශවීය | 106,677 | 124,470 | 134,065 | 151,273 | 168,585 |
| වෙළෙඳ ණය | 10,680 | 12,024 | 10,406 | 9,667 | 8,737 |
| විදේශ සැපයුම් කරුවන්ගේ ණය | 107 | 1,260 | 1,094 | 1,065 | 950 |
| නොපියවූ මුළු රාජ්‍ය ණය | 310,780 | 366,698 | 405,558 | 483,909 | 549,292 |
| තිදන් අරමුදල් අත්හළ පසු නොපියවූ මුළු රාජ්‍ය ණය | 309,119 | 365,858 | 405,199 | 483,589 | 549,246 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) 1993 දී රුපියල් දශලක්ෂ 24,088ක දිගුකාලීන බැඳුම්කර ඇතුළත්ය.

# දේශීය ණය සංයුතිය




* දළ දේශීය ණය වලින් නිදන් අරමුදල් අඩු කළ පසු.

ශ්‍රී ලංකා මහ බැංකුව.

නොපියවූ මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 97 ක් පමණ සහනදායී කොන්දේසි යටතේ බහු පාර්ශ්වීය හෝ ද්විපාර්ශ්වීය ණය ප්‍රදනයන්ගෙන් ලබාගන්නා ලද ණය වේ. දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව විදේශීය ණය ප්‍රමාණය 1993 පැවති සියයට 54.1 සිට 1994 දී සියයට 51.9 දක්වා සුළු වශයෙන් පහත වැටීමක් සිදුවිය.

## දේශීය ණය


1994 වර්ෂය අවසාන වන විට නොපියවූ දේශීය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 249,118 වූ අතර එය 1993 වර්ෂය අවසානයේ පැවති නොපියවූ ණය ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 213,685 හා සැසඳීමේදී සියයට 17 ක වැඩිවීමක් විය. කෙටිකාලීන ණය ප්‍රමාණය (අවුරුදු 1 සහ අවුරුදු 1 ට අඩු) සියයට 7 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 108,726 ක්වූ අතර 1993 වර්ෂයේදී එම වැඩිවීම සියයට 4ක් විය. කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් මත නොපියවූ වගකීම රුපියල් දශලක්ෂ 96,360 ක්වූ අතර එය මුළු කෙටිකාලීන ණය ප්‍රමාණයෙන් සියයට 89 ක් නියෝජනය කරන ලදී. මේ සමග වසර දෙකක කල්පිරීමේ කාලය යටතේ නිකුත් කර තිබූ භාණ්ඩාගාර බිල්පත්වල වූ නොපියවූ ණය ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 2,535 ක ප්‍රමාණය සමග සැලකුවිට 1993 වර්ෂයේ පැවති නොපියවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 97,196 සිට 1994 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 98,895 දක්වා වැඩිවිය. කෙටිකාලීන ණය ප්‍රමාණයේ ඉතිරි කොටස ශ්‍රී ලංකා මහ බැංකුවේ අත්තිකාරම් ගිණුම යටතේ නිකුත් කරන ලද රුපියල් දශලක්ෂ 1,864 ක ණය ප්‍රමාණය මගින් සිදු කරන ලද අතර 1994 වසර අවසානය වන විට එහි නොපියවූ ශේෂය රුපියල් දශලක්ෂ 12,366 ක් විය.

මුළු මධ්‍ය හා දිගුකාලීන බැඳුම්කර වලින් සියයට 98 ක් නියෝජනය කරමින් රුපියල් ණය ප්‍රමාණය 1994 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 137,554 ක්වූ අතර, 1993 වර්ෂයේ රාජ්‍ය වාණිජ බැංකු දෙකෙහි ප්‍රතිව්‍යුහගත කිරීම් සඳහා ලබා දෙන ලද රුපියල් දශලක්ෂ 24,088 ණය ප්‍රමාණයද ඊට ඇතුලත් වේ. රජයේ දේශීය ණය ගැනීමේ අවශ්‍යතාවයෙහි විශාල ප්‍රමාණයක් රුපියල් ණය නිකුත් කිරීම යටතේ සිදු කිරීම නිසා, නොපියවූ රුපියල් ණය වගකීම 1993 වර්ෂය අවසානයේ පැවති රුපියල් දශලක්ෂ 105,707 ක ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 31,847 ක් හෙවත් සියයට 30 කින් වැඩි විය. මෙම වැඩිවීම 1994 වර්ෂය තුළදී සිදු කරන ලද රුපියල් දශලක්ෂ 46,878 ක්වූ රුපියල් ණය ගැනීම් සහ රුපියල් දශලක්ෂ 14,956 ක ණය ආපසු ගෙවීම්වල ශුද්ධ ප්‍රතිඵලය විය. 1994 වර්ෂයේ නිකුත් කරන ලද රුපියල් ණයවලින් සියයට 60කට වඩා වාර්ෂික පොලී අනුපාතය සියයට 16ක් සහිත කල්පිරීමේ කාලය වර්ෂ 4-5 වූ රුපියල් ණය නිකුත් කිරීම් විය. 1994 වර්ෂයේදී ලබාගන්නා ලද රුපියල් ණය වලින් සියයට 27 ක් වාර්ෂික පොළී අනුපාතය සියයට 14.0 -14.5ක් වූ හා කල්පිරීමේ කාලය වර්ෂ 6 කට වඩා වැඩි රුපියල් ණය යටතේ ලබාගන්නා ලද අතර ඉතිරි ප්‍රමාණය වාර්ෂික පොලී ප්‍රතිශතය සියයට 14.5 - 15.0 වූ හා කල්පිරීමේ කාලය වර්ෂ 3-4 වන රුපියල් ණය යටතේ ලබා ගන්නා ලදි. සේවක අර්ථසාධක අරමුදල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව තවදුරටත් රුපියල් ණය වැඩසටහනේ ප්‍රධාන දයකයින් වූ අතර 1994 වර්ෂය අවසානය වන විට නොපියවූ මුළු රුපියල් ණයවලින් සියයට 80 ක් පමණ මෙම ආයතන දෙක යටතේ පැවතුනි.

## විදේශ ණය

1994 වර්ෂය අවසාන වනවිට විදේශ ණයෙහි නොපියවූ වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 300,174 ක්වූ අතර එය පෙර වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 29,950 ක හෙවත් සියයට 11 ක වැඩිවීමක් විය. මෙම විදේශ ණය ප්‍රමාණයේ වැඩිවීම, රුපියල් දශලක්ෂ 19,384 ක දළ ණය ගැනීම්, රුපියල් දශලක්ෂ 7,606 ක ණය ආපසු ගෙවීම් සහ රුපියල් දශලක්ෂ 18,172 ක්වූ විනිමය අනුපාත විචලනය යන කරුණුවල ශුද්ධ බලපෑම නිසා සිදුවිය. සහනදායී විදේශීය ණය ප්‍රමාණයේ නොපියවූ වගකීම රුපියල් දශලක්ෂ 30,880 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 291,437 ක් වූ අතර එය මුළු ණය ප්‍රමාණයෙන් සියයට 97 ක් විය. 1993 වර්ෂය අවසානයේදී මෙම ප්‍රතිශතය සියයට 96 ක් විය. රුපියල් දශලක්ෂ 168,585 ක් වූ ද්විපාර්ශ්වීය ණය ප්‍රමාණය සහනදායී ණය වලින් සියයට 58 ක් වූ අතර ඉතිරි ප්‍රමාණය බහු පාර්ශ්වීය ගිවිසුම් යටතේ ලබාගත් ණය වේ.

# විදේශීය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

### 1.63 සංඛ්‍යා සටහන
### විනිමය අනුපාතිකයේ විචලනයයන් විදේශීය ණය කෙරෙහි ඇති කළ බලපෑම 1990 - 1994 (අ)

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 තාවකාලික |
|---|---|---|---|---|---|
| 1. දළ ලැබීම් | 16,550 | 25,969 | 15,316 | 16,839 | 19,384 |
| 2. ආපසු ගෙවීම් | 4,451 | 4,881 | 7,955 | 6,984 | 7,606 |
| 3. ශුද්ධ ලැබීම් | 12,099 | 21,088 | 7,361 | 9,855 | 11,778 |
| 4. විනිමය අනුපාතිකයේ විචලනය නිසා වගකීමෙහි ඇති වූ වෙනස | 8,486 | 16,607 | 13,599 | 24,831 | 18,172 |
| 5. කාලච්ඡේදය අවසානයෙහි වගකීම | 176,883 | 214,578 | 235,538 | 270,224 | 300,173 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ලැබුන දිනය අනුව වටිනාකම සටහන් කිරීමේ ක්‍රමය පදනම් කොට ඇත.

ව්‍යාපෘති සහ වැඩසටහන් යටතේ වූ නොපියවූ ණය ප්‍රමාණය 1994 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 244,819 ක්වූ අතර මේ යටතේ 1994 වර්ෂය තුළ රුපියල් දශලක්ෂ 12,995 ක ශුද්ධ ණය ලබා ගැනීමට අමතරව විනිමය අනුපාතිකයේ විචලනය නිසා රුපියල් දශලක්ෂ 14,775 ක අමතර වගකීම් වැඩිවීමක් ද සිදු විය. නොපියවූ භාණ්ඩ ණය ප්‍රමාණය 1993 පැවති රුපියල් දශලක්ෂ 52,120 සිට රුපියල් දශලක්ෂ 53,727 දක්වා වැඩි විය. ව්‍යාපෘති ණය ප්‍රමාණයෙන් සියයට 97 සහ මුළු භාණ්ඩ ණය ප්‍රමාණයම වාගේ සහනදායී පදනම යටතේ ලබාගත් ණය වේ. විදේශ ණයෙහි විනිමය අනුපාතික විචලනයේ බලපෑම සංඛ්‍යා සටහන අංක 1.63හි දක්වා ඇත.

## ණය සේවා ගෙවීම්

රුපියල් දශලක්ෂ 22,671 ක් වූ ණය ආපසු ගෙවීම් හා රුපියල් දශලක්ෂ 38,031 ක් වූ පොළී ගෙවීම් වලින් සමන්විත ණය සේවා ගෙවීම් පෙර වර්ෂයට වඩා සියයට 6 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 60,702 ක් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ණය සේවා ගෙවීම් 1993 වර්ෂයේ පැවති සියයට 11.5 සිට 1994 දී සියයට 10.5 දක්වා ආන්තික වශයෙන් පහත වැටුණි. මෙය ප්‍රධාන වශයෙන්, කල්පිරුන රුපියල් සුරැකුම් ප්‍රමාණය අඩුවීම නිසා සිදු විය. රුපියල් දශලක්ෂ 7,606 ක් වූ විදේශ ණය ආපසු ගෙවීම, 1993 වර්ෂයට වඩා සියයට 9 ක වැඩිවීමක් වාර්තා කළේය.

1994 වර්ෂයෙහි භාණ්ඩාගාර බිල්පත්හි ඉහළ ඵලදායීතාවය පිළිබිඹු කරමින් රුපියල් දශලක්ෂ 18,712 ක් වූ කෙටිකාලීන ණය මත පොළී ආපසු ගෙවීම් 1993 වර්ෂයෙහි දක්නට ලැබුණු සියයට 12 ක වර්ධනය හා සසඳන කළ සියයට 40 ක වර්ධනයකි. රුපියල් දශලක්ෂ 13,808 ක් වූ මැදි හා දිගුකාලීන ණය මත පොළී ගෙවීම් 1993 වර්ෂයෙහි වූ සියයට 27 හා සසඳන කළ 1994 දී සියයට 18 කින් වර්ධනය විය. මෙම වර්ධනය 1993 පසු භාගයේදී රුපියල් ණය සඳහා ඉහළ පොළී අනුපාතිකයන් ප්‍රදනය කිරීම හා 1994 වර්ෂයෙහි ඉහළ ගිය නොපියවූ ණය ප්‍රමානය නිසා සිදු විය.

1994 වර්ෂයෙහි විදේශ ණය මත පොළී ගෙවීම් සියයට 8 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 5511 ක් විය. 1993 වර්ෂයෙහි මෙහි සංසන්දනාත්මක අගය රුපියල් දශලක්ෂ 5,102 ක් වූ අතර එය 1992 වර්ෂයෙහි විදේශ ණය මත පොළී ගෙවීම් වලට වඩා සියයට 8 ක වැඩිවීමකි. රජයේ ණය සේවා ගෙවීම් පිළිබඳ සංඛ්‍යාත්මක සාරාංශයක් සංඛ්‍යා සටහන් අංක 1.64 හි දක්වා ඇත.

**1.64 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය ණය සේවාකරණය ගෙවීම් (1990-1994)**

රුපියල් දශලක්‍ෂ

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 තාවකාලික |
|---|---|---|---|---|---|
| ණය සේවා කරණ ගෙවීම් | 32,878 | 39,885 | 52,018 | 57,286 | 60,702 |
| (1) ණය ආපසු ගෙවීම් | 12,210 | 17,782 | 26,078 | 27,290 | 22,671 |
| (අ) දේශීය | 7,304 | 12,901 | 18,123 | 20,327 | 15,065 |
| (ආ) විදේශීය | 4,906 | 4,881 | 7,955 | 6,963 | 7,606 |
| (2) පොළී ගෙවීම් | 20,668 | 22,073 | 25,940 | 30,203 | 38,031 |
| (අ) දේශීය | 16,990 | 17,960 | 21,201 | 25,101 | 32,520 |
| කෙටි කාලීන | 9,563 | 10,410 | 11,923 | 13,351 | 18,712 |
| මැදි හා දිගුකාලීන | 7,427 | 7,550 | 9,278 | 11,750 | 13,808 |
| (ආ) විදේශීය | 3,678 | 4,113 | 4,739 | 5,102 | 5,511 |
| පොළී ගෙවීම්/වර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස | 28.8 | 26.4 | 28.9 | 29.9 | 29.9 |
| ණය සේවාකරණ ගෙවීම්/දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 10.2 | 10.7 | 12.2 | 11.5 | 10.5 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

1994 වසර ජාතික මැතිවරණ වසරක් බව එළිදරව් විමත් සමග රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි ලිහිල්වීමක් සිදුවිය. දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව ජංගම ගිණුම් කටයුතු මගින් සියයට 1.1 අතිරික්තයක් වර්ධනය කිරීම සහ සමස්ත අයවැය හිඟය දළ ජාතික නිෂ්පදිනයෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 6.8 ක මට්ටමෙහි රඳවා ගැනිම සඳහාත් ස්ථාවර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අනුගමනය කිරීම කෙරෙහි යොමු වුවද, ආදයම් රැස්කිරීමේ ප්‍රයත්නයන්ගේ දුර්වලවීම හා ලිහිල් වියදම් ප්‍රතිපත්තීන්ද නිසා ජංගම ගිණුමේ හිගය දළ ජාතික නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 2.9 දක්වා සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩිවූ අතර ඉහළ පරිමාණයේ දේශිය ණය ගැනීම් අවශ්‍යතාවයන් ඇති කරමින් සමස්ත අයවැය හිගය දළ ජාතික නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 10.0 දක්වා වැඩි විය. විවිධ සහනයන් සැලසීම සඳහා ආනයන බදු, පිරිවැටුම් බදු සහ ආදයම් බදු අඩු කිරිම වැනි කටයුතු වලින් රජයේ ආදයම් රැස්කිරීමේ ප්‍රයත්නය දුර්වල කළ අතර විවිධ සහනදයි පියවරයන් නිසා ජංගම වියදමේ විශාල ඉහළයාමක් සිදුවිය. මෙම සිදුවීම් තුලින් ආර්ථිකයේ සැළකිය යුතු ඉල්ලුම් පීඩනයක් වර්ධනය කරන ලද අතරම බදු පදනම ඛාදනය වීම සහ විශ්‍රාම වැටුප් , වේතන, කුටුම්භ පැවරුම් සහ පොළි ගෙවිම් ඉහළ යැම තුලින් රාජ්‍ය අයවැයෙහි ව්‍යුහාත්මක ප්‍රශ්න තව තවත් අවුල් සහගත තත්ත්වයකට පත් කරන ලදී. රජයේ මූල්‍ය කටයුතු ඒකාබද්ධ කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබූ රාජ්‍ය අංශයේ රැකියා ආයතනයන්හි සේවක තනතුරු විධිමත් කිරිම පරිපාලිත මිළ නිවැරදි කිරීම් සහ සුභසාධක කටයුතු විධිමත් කිරීම් යනාදී දැනට ක්‍රියාත්මක වන ව්‍යූහාත්මක ප්‍රතිසංස්කරණයන්,මගින් රාජ්‍ය මූල්‍ය කටයුතු ශක්තිමත් කිරිම සඳහා කරන ලද කටයුතු 1994 වර්ෂයේදී පසුබෑමකට ලක් වූ අතර එමගින් ඉදිරි රාජ්‍ය මූල්‍ය ගැලපීම් තව තවත් දුෂ්කරතාවයන්ට පත් කරන ලදි.